# ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ

# රීති මාලාව

(ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත රීති මාලාව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද අවසන් කෙටුම්පත)

(ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන ලද රීති මාලාව 2012 ජනවාරි මස 29 වැනි දින සම්මත කරන ලදි.)

(සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද රීති මාලාව 20.......... වැනි දින සම්මත කරන ලදි.)

**ගරු සාමාජික මහත්ම මහත්මීන්ගේ කාරුණික අවධානය පිණිස.**

ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ අත්‍යවශ්‍ය අංගයක් වූ රීති මාලාව 2012 ජනවාරි 29 වැනි දින සම්මත කර ගන්නා ලද අතර එයට සුදුසු යැයි හැඟෙන හා කාලීන අවශ්‍යතාවයන් මත වරින්වර නව සංශෝධන ඇතුළත් කරන ලදි .

දැනට පවතින රීති මාලාව ඇතුළත් පොතට අන්තර්ගත නොවූ එහෙත් සම්මත කරගන්නා ලද රීති, සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති සම්පාදන ලිපිගොනුවේ ඇතුළත්ව ඇති අතර එය සංස්කරණය කර යාවත්කාලීන කිරීම කාලෝචිත අවශ්‍යතාවයකි.

විධායක කමිටු සාමාජික හා ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ නියෝජිත ඒ. පත්මසිරි මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ප්‍රකාශිත මෙම රීති මාලාව සිංහලට පරිවර්තනය කිරීම කාලෝචිත බව ලිපියක් මඟින් දන්වමින් එය යෝජනාවක් වශයෙන් සභාගත කරන ලදී. අනතුරුව විධායක කමිටු සාමාජික හා ගජබා ප්‍රවීණයන්ගේ සංගමයේ නියෝජිත මේජර් පී.එච්. විල්ටස් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි .

එම යෝජනාව සැලකිල්ලට ගත් විධායක කමිටුව අදාළ යෝජනාව 2019.02.28 දින එකී කමිටු රැස්වීමේ දී ඒකමතිකව සම්මත කර කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස යෝජනාකරුට දන්වන ලදි .

සාමාජිකත්වයේ දැනුම වැඩි අගයක් ගැනීම සඳහා සේවා මුක්ත භට සංගමය ආවරණය වන පනත් දෙකම (1976 අංක 8 දරන සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත හා 1992 අංක 42 දරන ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන පනත)) මෙයට ඇතුළත් කොට ඇත. හුදෙක්ම එය අවබෝධය පිණිස මිස එය ඒ ආකාරයෙන්ම තිබිය යුතු හා වෙනස් නොකළ යුත්තකි.

මෙම රීති මාලාව පරිවර්තනය කරන ලද්දේ දිවුරුම් දුන් භාෂා පරිවර්තක හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයෙකු වශයෙන් කටයුතු කළ ක්ෂේත්‍රයේ ප්‍රවීණ අයෙකි. ඔහුගේ නිල මුද්‍රාව සහිත මුල් පිටපත සේවා මුක්ත භට සංගම් කාර්යාලය සතුව පවතී.

රීති මාලාවේ සිංහල පරිවර්තන කෙටුම්පත 2019 අප්‍රේල් මස 11 වැනි දින විධායක කමිටුවේ සියලු සාමාජිකයින් වෙත බෙදා දුන් අතර. එහි ඇති දෝෂ තත්ත්වයන් පැහැදිලි කිරීම බෙදා දීමේ මුඛ්‍ය පරමාර්ථය වේ. සංගමයේ සියලු සාමාජිකයින් වෙත පුළුල් ප්‍රසිද්ධියක් ලබා දී මෙම කෙටුම්පතේ ඇති පහත සඳහන් ශීර්ෂයන්ට අදාළ දෝෂ නිවැරදි කර 2019 ජූලි මස එළැඹෙන විධායක කමිටු රැස්වීමට ප්‍රථම අනුබද්ධිත සංගම් වශයෙන් හෝ පුද්ගලිකව ලියා දන්වන ලෙස ඉල්ලීමක් කරමි.

01. ව්‍යාකරණ දෝෂ සහ අක්ෂර වින්‍යාසය
02. රීතිවල ඇති සම්බන්ධතාවය හා ගැළපීම්
03. පරිවර්තිත වචනවල අර්ථාන්විත බව
04. සංස්කරණය පිළිබඳ අදහස්

මෙම රීති ප්‍රකාශනය කෙටුම්පතක් පමණක් බව සලකනු ලබන අතර, 2020 වර්ෂයේ වාර්ෂික මහා මණ්ඩල රැස්වීමේදී සියලු සාමාජිකයින් වෙත බෙදා දීමට හැකි වන පරිදි රීති සමාලෝචන කමිටුවක් මඟින් සකස් කරන ලද සිංහල භාෂාවෙන් මුද්‍රිත රීති මාලාව සහිත පොතක් බෙදා හැරීමට යෝජනා කරමි.

මෙයට,

කේ.ඒ. ඥානවීර උ:සේ:ප: බ්‍රිගේඩියර් (විශ්‍රාමික)
ගරු සභාපති
ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය

# පරිවර්තිත රීති මාලාව සඳහා පෙරවදන

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති මාලාව සහිත පොත ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත්කර තිබීම හේතුවෙන් සංගමයේ බහුතර සාමාජික සංඛ්‍යාවට කියවා තේරුම් ගෙන වටහා ගැනීමේ අපහසුතාවය නිසා එකී රීති පොත සිංහල භාෂාවට පරිවර්තනය කිරීම කාලෝචිත බව සමස්ත සාමාජිකත්වයේ පොදු මතය විය. එය ක්‍රියාවට නංවනු වස් විධායක කමිටු සාමාජිකයින් වන ඒ. පත්මසිරි මහතා (ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය) සහ මේජර් පී.එච්. විල්ටස් සිල්වා (විශ්‍රාමික ගජබා ප්‍රවීණයන්ගේ සංගමය) යන අය විසින් කරන්නට යෙදුණු යෝජනා ස්ථිරත්වයෙන් පසු පරිවර්තනය කරවීම සඳහා විධායක කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ හිටපු ගරු සභාපති බ්‍රිගේඩියර් කේ.ඒ. ඥානවීරගේ (විශ්‍රාමික) අධීක්ෂණය යටතේ සුදුසුකම් ලැබූ භාෂා පරිවර්තකයෙකුගේ සේවය ලබා ගනිමින් අදාළ රීති පොත සිංහලට පරිවර්තනය කර එහි ඇති දෝෂ තත්ත්වයන් ඇතොත් ඒවා සදොස් කිරීම සඳහා සියලු විධායක කමිටු සාමාජිකයින් වෙත වර්ෂ 2019 අප්‍රේල් මස 11 වැනි දින රීති පොතෙහි සිංහල පරිවර්තන කෙටුම්පත බෙදා දෙන ලදි.

භාෂා පරිවර්තක හට පරිවර්තන ගාස්තුව වශයෙන් රු. 8500/- ක් ගෙවන ලද අතර, ඒ සඳහා ...................... දින පැවති විධායක කමිටු රැස්වීමේදී අනුමැතිය ලැබිණ.

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ 2019 අප්‍රේල් මස පවත්වන්නට යෙදුණු වාර්ෂික මහා සම්මේලනයේ දී සිංහලට පරිවර්තනය කළ රීති මාලා කෙටුම්පත් දෙක (02) බැගින් සියලු අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම් වෙත නිරීක්ෂණය කිරීම සඳහා අදාළ සංගම්වල නියෝජිතයකු වෙත භාර දෙන ලදි.

විධායක කමිටු සාමාජිකයන් කිහිපදෙනෙකු විසින් පෙන්වා දුන්, පරිවර්තිත රීති පොතෙහි ඇතැම් වචන අනේකාර්ථ භාවයෙන් තොරව යොදා ගැනීම උචිත කාරණාවක් බැවින් ඒ පිළිබඳ දැනුමක් ඇති සාමාජිකයින් පිරිසක් පත්කළ යුතු බව විධායක කමිටුවේ මතය විය. සංගමයේ ගරු සභාපති මේජර් ජෙනරාල් උපුල් පෙරේරා ( විශ්‍රාමික) විසින් පහත නම් සඳහන් අයගෙන් සමන්විත අනුකමිටුව විධායක කමිටුවේ අනුමැතියට යටත්ව පත්කර එය ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සංස්කෘතියට හා පරිපාලනයට ගැළපෙන සේ සංස්කරණය කිරීමට උපදෙස් දෙන ලදි. හුදෙක්ම මෙය ඉංග්‍රීසියෙන් පළ කළ රීති පොතේ සිංහලයට පරිවර්තනය කිරීම පමණක් වන අතර, වාර්ෂික මහා සම්මේලනයට ඉදිරිපත් කර ව්‍යවස්ථානුකූල අනුමැතිය ලැබීමෙන් පසු මින් ඉදිරියට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පාලනය සඳහා මාර්ගෝපදේශකත්වය ලබා ගැනීමට සිංහලෙන් පළ කළ මෙම රීති මාලාව ඉවහල් වනු ඇති බව රීති පරිවර්තන කමිටුවේ මතය වේ.

පරිවර්තන කමිටුව බොහෝ අවස්ථාවල එක් රැස්ව ඉංග්‍රීසියෙන් පළ කළ රීති මාලාව සහිත පොත හා සිංහල පරිවර්තනය සමඟ සසඳා බලා ගැඹුරු අධ්‍යයනයක යෙදීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගරු සභාපති මේජර් ජෙනරාල් උපුල් පෙරේරා (විශ්‍රාමික) වෙත පිළිගන්වන ලදී. පසුව ........... දින පැවති විධායක කමිටුවේදී හා ......... දින පැවති වාර්ෂික සම්මේලනයේදී මෙම පරිවර්තිත රීති මාලාව සඳහා අනුමැතිය ලැබිණි. රීති පරිවර්තන (සිංහල) අනුකමිටුව පහත නම් සඳහන් සභාපතිවරයාගේ සහ සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| කොමාන්ඩර් | ටී.ඩී. වීරසිංහ (විශ්‍රාමික) ගරු සභාපති |
| මේජර් | ඒ.ඩබ්ලිව්. හෙන්රි (විශ්‍රාමික) සාමාජික |
| | කේ.එන්. පෙරේරා මහතා සාමාජික |
| | එච්.එම්.එස්. ජයවර්ධන මහතා සාමාජික |
| | ඒ. පත්මසිරි මහතා සාමාජික |

# පටුන


| | පටුන |
|---|---|
| **පූර්විකාව** | **vii** |
| **1 වැනි කොටස** | |
| නාමය - පරමාර්ථ - අනුශාසකවරු - සභාපති ''ඔනරිස් කව්සා'' | 1 |
| උපසභාපති '' ඔනරිස් කව්සා'' | |
| 1 වැනි රීතිය - නාමය | 1 |
| 2 වැනි රීතිය - පරමාර්ථ | 1 |
| 3 වැනි රීතිය - අනුශාසකවරු | 2 |
| 4 වැනි රීතිය - සභාපති ''ඔනරිස් කව්සා'' - උපසභාපති ''ඔනරිස් කව්සා'' | 2 |
| **2 වැනි කොටස** | |
| සාමාජිකත්වය - සාමාජිකත්වයට හිමි වරප්‍රසාද - විනය - අනුබද්ධිත සංගම් - සංස්ථාපිත සංගම් - අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම් ලැයිස්තුව - අනෙකුත් සංවිධානවලට අනුබද්ධවීම - සාමාජික මුදල් | 3 |
| 5 වැනි රීතිය - සාමාජිකත්වය | 3 |
| 6 වැනි රීතිය - සාමාජිකත්වයට හිමි වරප්‍රසාද | 5 |
| 7 වැනි රීතිය - විනය | 6 |
| 8 වැනි රීතිය - අනුබද්ධිත සංගම්, සංස්ථාපිත සංගම් | 6 |
| 9 වැනි රීතිය - අනුබද්ධිත සංගම් සහ සංස්ථාපිත සංගම් ලැයිස්තුව | 8 |
| 10 වැනි රීතිය - අනෙකුත් සංවිධානවලට අනුබද්ධවීම | 9 |
| 11 වැනි රීතිය - සාමාජික මුදල් | 9 |
| **3 වැනි කොටස** | |
| කළමනාකරණය - නිලධරයන් - නිලධරයන් තෝරා පත්කිරීම - රාජකාරි හා වගකීම් - මහා මණ්ඩලය - විධායක කමිටුව - පුරප්පාඩු - රැස්වීම් - ප්‍රතියුක්තය - යෝජනා ඉදිරිපත් කිරීම - ගණපූර්ණය. | 9 |

12 වැනි රීතිය - කළමනාකරණය 9

13 වැනි රීතිය - ශ්‍රීලසේමහස නිලධරයන් 9

14 වැනි රීතිය - නිලධරයන් තෝරා පත් කිරීම 10

15 වැනි රීතිය - නිලධරයන්ගේ රාජකාරි, කාර්යයන් සහ වගකීම් 15

16 වැනි රීතිය - මහා මණ්ඩලය 16

17 වැනි රීතිය - විධායක කමිටුව 18

18 වැනි රීතිය - මහා මණ්ඩලයේ සහ විධායක කමිටුවේ පුරප්පාඩු 20

19 වැනි රීතිය - රැස්වීම් 21

20 වැනි රීතිය - ප්‍රතියුක්තය 22

21 වැනි රීතිය - යෝජනා ඉදිරිපත් කිරීම 23

22 වැනි රීතිය - ගණපූර්ණය 23

**4 වැනි කොටස** 24

මුදල් සහ ගිණුම් 24

23 වැනි රීතිය - මුදල් සහ ගිණුම් 24

**5 වැනි කොටස**

25

භාරකරුවන්

24 වැනි රීතිය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකරුවන් 25

25 වැනි රීතිය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ ආයතනයේ භාරකරුවන් 27

**6 වැනි කොටස**

සංශෝධන - අත්හැරුණු කරුණු - අර්ථ නිරූපණ - පූර්වගාමිත්වය 28

26 වැනි රීතිය - සංශෝධන 28

27 වැනි රීතිය - අත්හැරුණු කරුණු 29

28 වැනි රීතිය - අර්ථ නිරූපණය 29

29 වැනි රීතිය - පූර්වගාමිත්වය 30

ඇමුණුම ''අ'' 2012 ජනවාරි 29 වැනි දිනට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධව සිටි සේවා මුක්ත භටයන්ගේ ස vi 30

ඇමුණුම ''ආ'' ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධ වීම සඳහා යෝග්‍ය ශ්‍රී ලංකා නාවික හමුදාවේ අංශ 32

ඇමුණුම ''ඇ'' ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධ වීම සඳහා යෝග්‍ය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෘත්තීන් 32

**පරිසමාප්තිය** 33

**පළමුවැනි උපලේඛනය** - පසුව සම්මත කරන ලද රීති සංශෝධන මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද අභියෝජනා 33

**දෙවැනි උපලේඛනය** - යුද්ධ දයානුග්‍රහ අරමුදල ප්‍රතිස්ථාපනය කිරීම. 34

**තුන්වැනි උපලේඛනය** - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යහ සාධක භාරකාර අරමුදල 35

**හතරවැනි උපලේඛනය** - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණ රණවිරු නිවාස භාරකාර අරමුදල 36

**පස්වැනි උපලේඛනය** - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධක පහසුකම් සංවර්ධන අරමුදල 36

රීතිවලට පසුව සිදු කරන ලද සංශෝධන 39

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත 50

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1992 අංක 42 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත 62

# පූර්විකාව

ශ්‍රී ලංකා සේවා මුක්ත  භටයන්ගේ සංගමය කළමනාකරණය සඳහා වන රීති 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත වශයෙන් හඳුන්වනු ලබන එකී සංගමය පිහිටවනු ලැබූ මුල් ප්‍රඥප්තිය තුළ ප්‍රථමවරට ලේඛනගත කරනු ලැබූ අතර එම ප්‍රඥප්තියේ පළමු උපලේඛනයේ මෙම රීති අන්තර්ගත වේ.

මෙහි සඳහන් යම් රීතියක් වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී නව රීති සෑදීමට වුව ද මෙම පනත මගින් සංගමයට බලය ලබා දී ඇත. (පනතේ 5 වැනි වගන්තිය)

1976 අංක 8 දරන පනත පසුව 1992 අංක 42 දරන පනතින් සංශෝධනය කරන ලදී. මෙම සංශෝධනය මගින් "සංස්ථාව" යන වචනය වෙනුවට "මහා මණ්ඩලය" යන වචන ආදේශ කරනු ලැබූ අතර එකී පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූල නොවන්නාවූ වෙනස්කම් කිරීමට නොහැකිවන ආකාරයට අතුරු නියෝගයක් ද ඇතුළත් කරන ලදී.

එහෙත් නව රීති සෑදීමටත් පවත්නා යම් රීතියක් වෙනස් කිරීමටත් සංගමයේ මහා මණ්ඩලයට මෙම පනත මගින් පැහැදිලිව බලය පවරන අතර එසේ වුවද එම ප්‍රඥප්ති දෙකෙහි යම් විධිවිධානයකට හෝ රටේ යම් ලිඛිත නීතියකට අනනුකූල නොවිය යුතුය.

ඉහත සඳහන් කරනු ලබන ප්‍රඥප්ති දෙකෙහි ලේඛන ගත කර ඇති යම් විධිවිධානයක් වෙනස් කිරීමද සංගමයට කළ නොහැකිය.

"ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය" යන නම එවැනි එක් විධිවිධානයක් වේ. 1976 අංක 8 දරන පනතේ 1 වගන්තිය මගින් ප්‍රකාශ කරන්නේ, "මේ පනත 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ" යනුවෙනි. "සේවා මුක්ත භටයන්" යන පාඨය ප්‍රඥප්තිය සෑම තැන්හිම භාවිතා කෙරේ. එසේ හෙයින් "සේවා මුක්ත භටයන්" යන නාමය "සේවා මුක්ත පුද්ගලයන්" යනුවෙන් වෙනස් කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වේ.

"යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල'' යන නාමයට ද එම අර්ථනිරූපණය අදාළ වන අතර මෙම නාමය ''සන්නද්ධ හමුදා සිහි කිරීමේ දිනය හා පොපි දින අරමුදල'' යනුවෙන් වෙනස් කිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍ය වනු ඇත.

එහෙත් අනෙකුත් උපලේඛන දෙක - තුන්වැනි හා හතරවැනි උපලේඛනවලට අදාළව මෙම පනත්වල යොමුකිරීම් නොමැති බැවින් මෙම අර්ථනිරූපණය එම උපලේඛනවලට අදාළ නොවන්නේය.

ඉහත සඳහන් ප්‍රඥප්ති දෙකෙහි සඳහන් විධිවිධානවලට අනුව, 2001 ජනවාරි 7 වැනි දින පවත්වන ලද සංගමයේ විශේෂ මහා මණ්ඩල රැස්වීමකදී මුල්ම රීති ප්‍රථමවරට සංශෝධනය කර සම්මත කරගන්නා ලදි .

වරක් සම්මත කර ගන්නා ලද මෙය, දෙවන සංශෝධනය මඟින් ස්වකීය කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සංගමයේ නිලධරයන්ට හැකි වන පරිදි සංගමයේ මෙහෙයුම් (සංග්‍රහය) අත්පොත යාවත්කාලීන කරනු ඇත.

වචන ප්‍රමාණයෙන් ව්‍යවස්ථාවක සාරාර්ථය කවර හෝ ආකාරයකින් වටහා ගැනීමට නුපුළුවන. රීතිවලට ලබාදිය හැක්කේ මාර්ගෝපදේශකත්වය පමණි. රීති සාරාර්ථය තහවුරු වන පරිදි සහ සංගමයේ සියලු සාමාජිකයින් හට සාධාරණත්වය තහවුරු වන පරිදි මෙම රීති අර්ථනිරූපණය කිරීම එම අවස්ථාවේ නිලතල දරන නිලධරයන්ගේ වගකීමකි.

1976 අංක 8 සහ 1992 අංක 42 දරන ප්‍රඥප්ති ද්විත්වය මෙම ප්‍රකාශනය අවසානයේ නැවත ඉදිරිපත් කර ඇත.

# ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති

## 1 වැනි කොටස

**නාමය - පරමාර්ථ - අනුශාසකවරු - සභාපති (ඔනරිස් කව්සා) - උපසභාපති (ඔනරිස් කව්සා)**

**1 වැනි රීතිය - නාමය**

''ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය'' යනුවෙන් නම්කර හඳුන්වනු ලබන මෙම සංගමය මෙහි මින්මතු ''ශ්‍රීලසේමුභස'' යන සංක්ෂිප්ත නාමයෙන් සඳහන් කරනු ලැබේ.

**2 වැනි රීතිය - පරමාර්ථ**

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

(අ) 1914-1918 හා 1939-1945 යුද්ධ සමයන්හි හෝ ඒ අතර කාල පරිච්ඡේදය තුළ ලංකාරක්ෂක හමුදාවේ යම් ඒකකයක හෝ ලංකා රාජකීය කාලතුවක්කු හමුදාවේ හෝ ලංකා නාවික ස්වේච්ඡා හමුදාවේ හෝ ඉක්බිතිව ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උප සේවාවේ සේවය කළ සහ පසුව ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව ලෙස හඳුන්වනු ලබන නිත්‍ය හෝ ස්වේච්ඡා, ලංකා යුධ හමුදාවේ යම් ඒකකයක රාජකීය ලංකා නාවික හමුදාවේ යම් අංශයක හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ යම් වෘත්තියක හෝ යම් පොදු රාජ්‍ය මණ්ඩලීය හමුදා ඒකකයක, සේවය කළ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සියලුම නිලයන් අතර සහෝදරත්වය හා ලැදියාව වර්ධනය කිරීම.

(ආ) එකී සේවා මුක්ත භටයන්ගේ සුභ සාධනය දියුණු කිරීම.

(ඇ) සේවා මුක්ත භටයන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් සහ එක් එක් සේවා මුක්ත භටයන් රැකියාවල යෙදවීමෙහිලා හෝ රැකියාව තුළ සේවා මුක්ත භටයන්ට අර්ථදායක වන වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය නියෝජන රජය සහ අනෙකුත් සේවා යෝජකයන් වෙත ඉදිරිපත් කිරීමෙන් සහය වීම.

(ඈ) ශ්‍රීලසේමුභස වෙත අනුබද්ධ කළ යුතු ශ්‍රී ලංකා යුධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පිළිවෙළින් යම් නිත්‍ය හෝ ස්වේච්ඡා ඒකකයක, අංශයක හෝ වෘත්තියක සේවය කර ඇති තැනැත්තන් හට අනුබද්ධිත සංගම් පිහිටුවා ගැනීමට සහ සංස්ථාපිත සංගම් පිහිටුවා ගැනීමට අනුග්‍රහය දැක්වීම හා දිරිගැන්වීම.

(ඉ) 1976 අංක 8 දරන පනතේ දෙවැනි උපලේඛනයේ අන්තර්ගත කර ඇති පරිදි ඒ කාර්යය සඳහා සාදනු ලැබිය හැකි යම් යම් නියෝගවලට අනුකූලව යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල නඩත්තු කිරීම, පවත්වා ගැනීම හා කළමනාකරණය කිරීම.

(ඊ) ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමේ දී ස්වකීය ජීවිත පූජා කළ හමුදා භටයන් සදානුස්මරණය කිරීම.

(උ) විධායක කමිටුවේ මතය අනුව මුදල් ආධාර අවශ්‍ය සේවා මුක්ත භටයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට මුදල් ආධාර දීම.

**3 වැනි රීතිය - අනුශාසකවරු, උපඅනුශාසකවරු**

(අ) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි සේනාධිනායක අතිගරු ජනාධිපතිතුමා සංගමයේ ප්‍රධාන අනුශාසක විය යුත්තේය.

(ආ) යුද්ධ, නාවික හා ගුවන් හමුදාවල හමුදාපතිවරු උපඅනුශාසකවරු විය යුත්තේය.

**4 වැනි රීතිය - සභාපති (ඔනරිස් කව්සා)**

(අ) මහා මණ්ඩලය විසින්, වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් විධායක කමිටුවේ නිර්දේශය මත , ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගුණාත්මක අභිවෘද්ධිය ඇති කිරීමට ඉතා විශිෂ්ට, සුවිශේෂී හා සාධනීය සේවාවක් ඉටුකර ඇති සංගමයේ ඕනෑම සාමාජිකයෙකු සභාපති (ඔනරිස් කව්සා) වශයෙන් තෝරා පත් කරනු ලැබිය හැකිය.

(ආ) එසේ තෝරා පත් කරනු ලබන සභාපති (ඔනරිස් කව්සා) ජීවිතාන්තය දක්වා හෝ එම තනතුර දරන්නාගේ අභිමතය ඇතිතාක් කල් නිලය දරනු ලබන්නේය.

(ඇ) සභාපති (ඔනරිස් කව්සා) ස්වකීය අභිමතය පරිදි මහා මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගී වනු ඇත.

(ඈ) එසේ තෝරා පත් කරනු ලබන සභාපති (ඔනරිස් කව්සා) වෙත විධායක කමිටුව විසින් අනුමත කර ඇති සැලැස්මකින් යුත් සුදුසු නිල ලාංඡනයක් පිරිනැමිය යුතුය.

**උපසභාපති (ඔනරිස් කව්සා)**

(අ) මහා මණ්ඩලය විසින්, වර්ෂ 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් තුළ සංගමයේ නිලධාරී මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ප්‍රශංසනීය සේවාවක් ඉටුකර ඇති පදනම මත විධායක කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇති ඕනෑම තැනැත්තෙකු යම් වාර්ෂික හෝ විශේෂ රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් උපසභාපති (ඔනරිස් කව්සා) වශයෙන් තෝරා පත් කරනු ලැබිය හැකිය.

(ආ) එසේ තෝරා පත් කරනු ලබන උපසභාපති (ඔනරිස් කව්සා) ජීවිතාන්තය දක්වා හෝ තනතුර දරන්නාගේ අභිමතය ඇති තාක් කල් නිලය දරනු ලබන්නේය.

(ඇ) උපසභාපති (ඔනරිස් කව්සා) හට මහා මණ්ඩලයේ හා විධායක කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගි වීමට අයිතිය ඇත්තේය.

(ඈ) එසේ තෝරා පත් කරනු ලබන උපසභාපති (ඔනරිස් කව්සා) වෙත විධායක කමිටුව විසින් අනුමත කර ඇති සුදුසු ලාංඡනයක් පිරිනැමිය යුත්තේය.

# 2 වැනි කොටස

**සාමාජිකත්වය - සාමාජිකත්වයට හිමි වරප්‍රසාද - විනය - අනුබද්ධිත සංගම් - සංස්ථාපිත සංගම් - අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම් ලැයිස්තුව - අනෙකුත් සංවිධානවලට අනුබද්ධ වීම - සාමාජික මුදල්**

**5 වැනි රීතිය - සාමාජිකත්වය**

(අ) **සාමාජිකත්වය සඳහා යෝග්‍යතාවය** - මෙම රීතිවල අර්ථ නිරූපණය කර ඇති පරිදි යුද්ධ හමුදාවේ යම් රෙජිමේන්තුවක/බළකායක, නාවික හමුදාවේ යම් අංශයක හෝ ගුවන් හමුදාවේ යම් වෘත්තියක සේවා මුක්ත තැනැත්තන්ගේ ඕනෑම සංගමයක සාමාජිකයෙකු මෙම රීති ප්‍රකාරව, ශ්‍රීලසේමුහස හි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේය.

(ආ) සාමාජිකත්වය ප්‍රභේද හතරකට අයත්වේ.

(1) සාමාන්‍ය සාමාජිකත්වය

(2) යාවජීව සාමාජිකත්වය

(3) සම්මානිත සාමාජිකත්වය

(4) ආශ්‍රිත සාමාජිකත්වය

(ඇ) **සාමාන්‍ය සාමාජිකත්වය** - සාමාන්‍ය සාමාජිකත්වය සඳහා අයැදුම් කිරීමට සුදුසු පුද්ගලයින් පහත සඳහන්වේ.

(1) 1914-1918 හා 1939-1945 යුද්ධ සමයන්හි යම් කාල පරිච්ඡේදයක හෝ ඒ අතර කාල පරිච්ඡේදයක දී ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පොදු රාජ්‍ය මණ්ඩලීය යම් හමුදා ඒකකයක සේවය කළ සියලුම ශ්‍රී ලංකාවේ පුරවැසියන්.

(2) ලංකාරක්ෂක හමුදාවේ හෝ ලංකා රාජකීය කාලතුවක්කු හමුදාවේ හෝ ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ හෝ ඉනික්බිතිව ලංකා රාජකීය ස්වේච්ඡා නාවික උප සේවාවේ යම් ඒකකයක සේවය කළ සියලුම ශ්‍රී ලංකාවේ පුරවැසියන්.

(3) ලංකා යුධ හමුදාවේ (දැනට ශ්‍රී ලංකා යුධ හමුදාව යනුවෙන් හඳුන්වන) හෝ රාජකීය ලංකා නාවික හමුදාවේ (දැනට ශ්‍රී ලංකා නාවික හමුදාව යනුවෙන් හඳුන්වන) හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ (දැනට ශ්‍රී ලංකා ගුවන් හමුදාව යනුවෙන් හඳුන්වන) යම් නිත්‍ය හෝ ස්වේච්ඡා ඒකකයක සේවය කළ සියලුම ශ්‍රී ලංකාවේ පුරවැසියන්.

(4) මීට පටහැනිව වෙනත් යම් රීතියක විධිවිධාන අන්තර්ගතව පැවතිය ද , 1967.12.31 වැනි දින සංගමයේ සාමාජිකයන්ව සිටි ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන සියලුම අයද සාමාජිකයන් වශයෙන් අඛණ්ඩව සිටිය යුතු අතර ඔවුන් විසින් සාමාජිකත්වයට අයත් සියලු වරප්‍රසාද හා ප්‍රයෝජන ඉදිරියටත් භුක්ති විඳිය යුත්තේය.

(5) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ දැනටමත් සාමාජිකයන් වී සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අගතියක් නොවන පරිදි ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඒකකයක ශ්‍රී ලංකා නාවික හමුදාවේ අංශයක හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෘත්තියක යම් නිත්‍ය හෝ ස්වේච්ඡා සාමාජිකයකු ලෙස සේවය කර ඇති ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකු ශ්‍රී ලංකා යුධ හමුදාවේ නම් ඔහුගේ හෝ ඇයගේ අනුබද්ධිත සංගමය හරහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නම් ඔහුගේ හෝ ඇයගේ අංශය අනුබද්ධිත සංගමය හරහා හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නම් ඔහුගේ හෝ ඇයගේ වෘත්තීය අනුබද්ධිත සංගමය හරහා සාමාජිකත්වය ඉල්ලුම් කිරීම සඳහා සුදුසු වන්නේය.

(ඈ) **යාවජීව සාමාජිකත්වය** - වසර 10කට වැඩි කාලයක් මහා මණ්ඩලයේ සහ එම සම්පූර්ණ කාලයෙන් වසර 5කට නොඅඩු කාලයක් විධායක කමිටු හෝ අනුකමිටු සාමාජිකයෙකු වශයෙන් සේවය කළ සහ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සුභ සිද්ධිය උදෙසා සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇති සියලුම සාමාජිකයන් විධායක කමිටුවේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින් යාවජීව සාමාජිකත්වය සඳහා තෝරා පත්කරගනු ලැබීමට සුදුසු වන්නේය. මහා මණ්ඩලයේ සාමාජිකයෙකු වන යම් සාමාජිකයෙකු කිසියම් හේතුවක් නිසා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට සහභාගී වීමට නොපැමිණියහොත් හෝ පැමිණීමෙන් නිදහස්කරනු ලැබුවහොත්, මහා මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් වර්ෂ සංඛ්‍යාව ගණනය කිරීමේ දී එම නිශ්චිත වර්ෂය සැලකිල්ලට ගනු නොලබන්නේය. එම සාමාජිකයන්ට, 16 වැනි රීතියේ (අ) (1)

යටතේ නම්කරනු ලැබ ඇති ඔහුට/ඇයට අනෙකුත් නියෝජිතයන්ට මෙන්ම, ඒ හා සමාන අයිතිවාසිකම් හා වරප්‍රසාද හිමිවිය යුත්තේය. එසේ තෝරා පත් කරගනු ලබන යාවජීව සාමාජිකයෙකු වෙත විධායක කමිටුව විසින් අනුමත කර ඇති සුදුසු ලාංඡනයක් පිරිනැමිය යුත්තේය.

(ඉ) **සම්මානිත සාමාජිකත්වය** - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති යටතේ සාමාජිකත්වය සඳහා අන්‍යාකාරයකින් සුදුසුකම් ලබන යම් ශ්‍රී ලාංකීය නොවන පුරවැසියෙකු විධායක කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි සම්මානිත සාමාජිකත්වය සඳහා ඇතුළත් කරනු ලැබිය හැකිය.

**උදා :** වෙනත් රටකට සංක්‍රමණය වී ඇති සේවා මුක්ත භටයකු.

(ඊ) **ආශ්‍රිත සාමාජිකත්වය** - සේවා රෙගුලාසි සහ නියෝගයන් මගින් තමන්ව සේවා මුක්ත භට සංවිධානවලට සම්බන්ධ වීම තහනම් නොකරනු ලබන්නා වූ සේවයේ නියුතු සන්නද්ධ හමුදා නිලධාරීන් සහ සෙසු නිලයන්/තරාතිරමේ භටයන් වෙත අනුබද්ධිත සංගම් විසින් ආශ්‍රිත සාමාජිකත්වය පිරිනැමිය හැකිය. ආශ්‍රිත සාමාජිකයන්ට රැස්වීම්වලට සහභාගි විය හැකි නමුත් ඔවුන්ට තනතුරු දැරීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම කළ නොහැකිය. ඔවුන් සේවයෙන් ඉවත්ව යන විගසම 5 වැනි රීතියෙහි විධිවිධාන සලසා ඇති පරිදි අනෙකුත් සියලුම අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් ඔවුන් ස්වයංක්‍රීයව පූර්ණ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබනු ඇත.

(උ) යම් සේවා මුක්ත තැනැත්තෙකුට අනුබද්ධිත සංගම් එකකට වැඩි ප්‍රමාණයක සාමාජිකයෙකු විය හැකිය. එසේ වුව ද ඔහුට/ඇයට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමට හැකිවන්නේ ඔහුගේ /ඇයගේ මව් සංගමය හරහා පමණි.

(ඌ) සාමාජිකත්වය සඳහා වන සියලුම අයදුම්පත්, අයදුම්කරු අනුබද්ධිත මව් සංගමය හරහා ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු අනුබද්ධිත සංගම් එකකට වඩා වැඩි ප්‍රමාණයක සාමාජිකත්වය දරන සාමාජිකයෙකු විය හැකිය. එහෙත් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ අවශ්‍යතා සඳහා එවැනි සංගම්වල සාමාජික සංඛ්‍යාව ගණනය කිරීමේ දී ඔහුගේ/ඇයගේ මව් සංගමයේ ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය පමණක් සැලකිල්ලට ගනු ලබන්නේය.

**6 වැනි රීතිය - සාමාජිකත්වයට හිමි වරප්‍රසාද**

(අ) සියලුම අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම්වලට අයත් වන්නාවූ ශ්‍රීලසේමුභස ට ඇතුළත් වන සියලුම සේවා මුක්ත භටයන් ශ්‍රීලසේමුභස විසින්

ප්‍රදානය කරනු ලබන සියලුම පහසුකම් හා වරප්‍රසාදවලට එක්ව හා වෙන් වෙන්ව හිමිකම් ලැබිය යුත්තේය.

(ආ) මෙම රීතිවල විස්තර කරනු ලබන සේවා මුක්ත භටයෙක්, අනුබද්ධිත සංගමයක් හෝ සංස්ථාපිත සංගමයක් විසින් ශ්‍රීලසේමුභස හි යම් රීතියක් කඩ කර තිබේ නම් එකී සේවා මුක්ත භටයාට හෝ අනුබද්ධිත සංගමයට හෝ සංස්ථාපිත සංගමයට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය විසින් කිසිම පහසුකමක් ප්‍රදානය නොකළ යුතුය.

### 7 වැනි රීතිය - විනය

(අ) ලැදියාව හා විනීත බව පිළිබඳ උසස් අවබෝධයකින් හෙබි විනය ගරුක තැනැත්තන් බවට පත්වීමට වසර ගණනාවක් පුරුදු පුහුණු වීම් ලබා ඇති ලංකා හෝ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි සේවයේ නියුතුව සිටි තැනැත්තන්ගෙන් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය සමන්විත වේ. සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකයන්ගෙන් උසස් චර්යාවක් අපේක්ෂා කරනු ලබන අතර එය සපුරාලිය නොහැකි බව පෙනී ගියහොත් විධිමත් පරීක්ෂණයකින් පසුව විධායක කමිටුවේ අධිකාරි බලය මගින් සාමාජිකත්වයෙන් ඉවත්කරනු ලැබිය යුත්තේය. එසේ ඉවත්කරනු ලබන සාමාජිකයෙකුට ඔහුගේ අනුබද්ධිත සංගමය හරහා මහා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර මහා මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත අධිකරණයක් මගින් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබූ යම් සේවා මුක්ත භටයෙකු සාමාජිකත්වය සඳහා සුදුසුකම් නොලබන්නේය. ශ්‍රී ලංකාව තුළ හෝ පිටත අධිකරණයක් මගින් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය වහාම අවසන් වන්නේය.

(ඇ) අපකීර්තියක් සහිතව අධිකාරියෙන් ඉවත් කරනු ලැබ ඇති යම් නිලධාරියෙකු හෝ අවමන් සහිතව සේවයෙන් පහ කර ඇති හෝ දඬුවමක් ලෙස සම්පූර්ණ සේවය අහිමි කරනු ලැබූ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සෙසු නිලයන් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකත්වය ලැබීමට සුදුසු නොවන්නේය.

8 වැනි රීතිය - අනුබද්ධිත සංගම් - සංස්ථාපිත සංගම්

(අ) **අනුබද්ධිත සංගම්** - සාමාජිකත්වය සඳහා දැනටමත් පිළිගෙන ඇති සංගම්වලට අගතියක් නොවන පරිදි 9 වැනි රීතිය යටතේ ලැයිස්තුගත කර ඇති සංගම් සහ අවම වශයෙන් 100ක සාමාජිකත්වයක් සහිතව ආරම්භ කරනු ලැබූ සහ පිළිගනු ලබන සංගම්වලින් සමන්විතවේ. විදේශීය ශාඛාවක් නම් අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව 25 ක් විය යුත්තේය.

**(ආ) සංස්ථාපිත සංගම්**

**(1)** යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ යම් රෙජිමේන්තුවක, බළකායක, අංශයක, නිල/තරාතිරම්වලට සාමාජිකත්වය සීමා නොවන, නිදසුන් වශයෙන් "ආබාධිත තැනැත්තන්" , "විශ්‍රාමිකයන්", '' *II* වන ලෝක යුද්ධ ප්‍රවීණයන්'' හෝ දිස්ත්‍රික් සංවිධාන වැනි විශේෂ අභිලාෂයන් නියෝජනය කරන්නාවූ ආයතන, සංස්ථාපිත සංගම් යනුවෙන් අදහස් වේ. එහෙත් *II* වැනි ලෝක යුද්ධයේ ලංකා යුද්ධ ප්‍රවීණයන්ගේ සංගමයට හා මහනුවර සේවා මුක්ත භටයන්ගේ සංගමයට මෙම රීතිය අදාළ නොවන්නේය.

**(2)** සංස්ථාපිත සංගම් සාමාජිකත්වය ලබාගැනීමට පෙර සංස්ථාපිත සංගමයක සාමාජිකයෙකු අනුබද්ධිත සංගමයක සාමාජිකයෙකු විය යුතුය.

**(3)** සංස්ථාපිත සංගමයක අධිකාරි බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් වන්නා වූ හෝ එම බල ප්‍රදේශය තුළ ස්ථිරවම රැකියාවේ නියුතු, සේවා මුක්ත භටයන් පමණක් එම ප්‍රදේශයේ සංස්ථාපිත සංගමයේ සාමාජිකත්වය සඳහා සුදුසු වන්නේය. සේවා මුක්ත භටයෙකු එම නිශ්චිත ප්‍රදේශයේ උපත ලබා තිබීම එම ප්‍රදේශයේ සංස්ථාපිත සංගමයේ සාමාජිකත්වය ලැබීමට හුදු සුදුසුකමක් ලෙස නොසැලකේ.

**(4)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මහා මණ්ඩලය හා විධායක කමිටුව නියෝජනය කරන සාමාජික සංඛ්‍යාව නිර්ණය කිරීම සඳහා අනුබද්ධිත සංගමයේ මුළු සාමාජික සංඛ්‍යාව ගණනය කිරීමේදී එම අනුබද්ධිත සංගමයට සම්බන්ධ සංස්ථාපිත සංගමයේ සාමාජික සංඛ්‍යාව සැලකිල්ලට නොගත යුතුය.

**(5)** සංගම් එකකට වඩා වැඩි ප්‍රමාණයක සාමාජිකත්වය දරන සාමාජිකයෙකු මහා මණ්ඩලය තුළ ස්වකීය සංගමය හෝ සංස්ථාපිත සංගමය නියෝජනය කිරීමට

නම් කරනු ලබන්නේ නම්, මහා මණ්ඩලය තුළ එම සාමාජිකයාට එක ඡන්දයක් පමණක් තිබිය යුතුය.

(ඇ) අනුබද්ධිත සංගම් සහ සංස්ථාපිත සංගම්වල ව්‍යවස්ථාව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීතිවලට අනුකූල විය යුතු අතර එයට පටහැනිව කිසිම විධි විධානයක් අඩංගු නොවිය යුතුය.

**9 වැනි රීතිය - අනුබද්ධිත සංගම්වල සහ සංස්ථාපිත සංගම්වල ලේඛනය**

(අ) 2012 ජනවාරි 29 දිනට, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට දැනට අනුබද්ධ යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා සේවා මුක්ත භටයන්ගේ සංගම් ඇමුණුම් ''අ''හි දක්වා ඇත.

(ආ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන නාවික හමුදාවේ අංශ හා ගුවන් හමුදාවේ වෘත්තීන් පිළිවෙළින් ඇමුණුම් ''ආ'' සහ ''ඇ'' හි සඳහන් පරිදි වේ.

(ඇ) මෙම විධිවිධානයෙහි එසේ සඳහන් වුව ද, යම් නව රෙජිමේන්තුවක්/බළකායක්, අංශයක් හෝ වෘත්තියක් 5 (අ) රීතියෙහි සඳහන් කර ඇති පරිදි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ඈ) **සංස්ථාපිත සංගම් -**

2012 ජනවාරි 29 වැනි දිනට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට පහත දක්වා ඇති සංස්ථාපිත සංගම් අනුබද්ධ කරන ලදී.

**(i)** මාතලේ සේවා මුක්ත භටයන්ගේ සංගමය
**(ii)** ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා විශ්‍රාමිකයන්ගේ සංගමය
**(iii)** ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (ඕස්ට්‍රේලියානු ශාඛාව) සංස්ථාගත
**(iv)** ඌව පළාත් සේවා මුක්ත භටයන්ගේ සංගමය
**(v)** ශ්‍රී ලංකා සේවා මුක්ත පුද්ගලයන්ගේ සංගමය - එක්සත් රාජධානිය

(ඉ) ඉහත 8 වැනි රීතියේ විධිවිධානවලට යටත්ව, වරින් වර පිහිටුවා ගනු ලබන වෙනත් සේවා හෝ රෙජිමේන්තු සංගම් හෝ සංස්ථාපිත සංගම්වලට අනුබද්ධ වීම සඳහා අයදුම් කළ හැකිය.

(ඊ) දැනටමත් සාමාජිකත්වය සඳහා ඇතුළත් කරගනු ලැබ ඇති සංස්ථාපිත සංගම් සහ අනුබද්ධිත සංගම්වලට අගතියක් නොවන පරිදි, සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන අනුබද්ධිත සංගමයක් හෝ සංස්ථාපිත සංගමයක් ස්වකීය

ඉල්ලුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ සාමාජිකත්වය තහවුරු කරනු ලැබූ යටත් පිරිසෙයින් සාමාජිකයන් සියයක් සිටිය යුතුය. විදේශ රටක ශාඛාවක් නම් නියමිත සංඛ්‍යාව විසිපහකි. අනුබද්ධිත සංගම් හෝ සංස්ථාපිත සංගම්වල උප අංශ, මේ යටතේ හෝ මෙහි වෙනත් යම් රීතියක් යටතේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු නොවේ.

(උ) සාමාජිකත්වය සඳහා ඉදිරිපත් කරන ඕනෑම අයදුම් පත්‍රයක් වලංගු හේතු මත ප්‍රතික්ෂේප කිරීමේ බලය විධායකය කමිටුව සතු විය යුතුය.

(ඌ) යම් සංස්ථාපිත සංගමයක තැනැත්තෙකු විසින් අනුබද්ධ වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, නැවත සලකා බැලීම සඳහා මහා මණ්ඩලයට අභියාචනයක් කළ හැකිය.

**10 වැනි රීතිය - වෙනත් සංවිධානවලට අනුබද්ධ වීම**

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට විධායක කමිටුවේ අභිමතය පරිදි සමාන අරමුණු හා පරමාර්ථ ඇත්තාවූ විදේශීය වෙනත් යම් සංවිධානවලට අනුබද්ධ විය හැකිය.

උදා : (අ) රාජකීය පොදු රාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත ලීගය

(ආ) ලෝක යුද්ධ ප්‍රවීණයන්ගේ සම්මේලනය.

**11 වැනි රීතිය - සාමාජික මුදල්**

ස්වකීය අනුබද්ධිත සංගමය හරහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකත්වය අපේක්ෂා කරන නව එක් එක් සාමාජිකයෙකු විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තුව, ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී වාර්ෂිකව තීරණය කළ යුතුය.

# 3 වැනි කොටස

**කළමනාකරණය - නිලධරයන් - නිලධරයන් තෝරා පත් කිරීම - රාජකාරි හා වගකීම් - මහා මණ්ඩලය - විධායක කමිටුව - පුරප්පාඩු - රැස්වීම් - ප්‍රතියුක්තය - යෝජනා ඉදිරිපත් කිරීම - ගණපූර්ණය**

**12 වැනි රීතිය - කළමනාකරණය**

මහා මණ්ඩලය විසින් මෙම රීති රාමුව තුළ තීරණය කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුකූලව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ කටයුතු විධායක කමිටුව විසින් කළමනාකරණය කළ යුතුය.

13 වැනි රීතිය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ නිලධරයන්

(අ) ආසන්නතම හිටපු සභාපතිවරයා සහ ගරු උපලේකම්වරු තිදෙනා සහ ගරු උප භාණ්ඩාගාරික හැර තෝරා පත්කරගත යුතු ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ නිලධරයන් පහත සඳහන් පරිදි වේ.

**(1)** සභාපතිවරයා

**(2)** හිටපු සභාපතිවරයා - (නිල බලයෙන්)

**(3)** උපසභාපතිවරු තිදෙනෙක් - සේවාවන් තුනම නියෝජනය කරමින්

**(4)** ගරු මහ ලේකම්

**(5)** ගරු භාණ්ඩාගාරික

**(6)** ගරු උපලේකම්වරු තිදෙනක් - සේවාවන් තුනම නියෝජනය කරමින්

**(7)** ගරු උපභාණ්ඩාගාරික

(ආ) උපසභාපතිවරු තිදෙනා තෝරා පත්කර ගැනීම සඳහා මහා මණ්ඩලයේ එක් එක් සාමාජිකයෙකුට ඡන්ද තුනකට හිමිකමක් තිබිය යුතුය. ඔහු, එක් එක් සේවාවන් හී ඔහු කැමැති අපේක්ෂකයාට පමණක් ඡන්දය ප්‍රකාශ කළ යුතුය. එකම සේවාවේ අපේක්ෂක/ අපේක්ෂකයින් එක්කෙනෙකුට හෝ වැඩි ප්‍රමාණයකට සාමාජිකයෙකු විසින් එක් ඡන්දයකට වඩා ප්‍රකාශ කරන ඡන්ද, නරක් වූ ඡන්ද ලෙස සැලකිය යුත්තේය.

(ඇ) සභාපතිවරයා විසින් ගරු උපලේකම්වරු තිදෙනා සහ ගරු උපභාණ්ඩාගාරික නම් කළ යුත්තේය.

(ඈ) අනුබද්ධිත සංගමයක් විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මහා මණ්ඩලයට නම්කර නොමැති කිසිම තැනැත්තෙකු නිලධරයෙක් වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුත්තේය.

(ඉ) ප්‍රධාන නිලධරයෙක් වශයෙන් තෝරා පත්කර ගැනීම සඳහා සුදුසුවන සේවා මුක්ත භටයෙක් අවම වශයෙන් වසර දෙකක කාල පරිච්ඡේදයක් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු හෝ අනුකමිටුවක සභාපති හෝ සාමාජිකයෙකු විය යුතුය. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපති, ගරු මහ ලේකම් හා ගරු භාණ්ඩාගාරික ප්‍රධාන නිලධරයන් වන්නේය.

(ඊ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ නිලධරයන් ස්වකීය තෝරා පත්කර ගැනීමේ දින සිට ඊළඟට එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන දිනය තෙක් ධූර දැරිය යුතුය.

(උ) ධූර කාලය අවසන් කරන සියලුම නිලධරයන් විසින් ස්වකීය අනුප්‍රාප්තිකයන්ට රාජකාරි භාර දිය යුතු අතර විධිමත් පරිදි රාජකාරි භාරදීම/භාරගැනීම සිදුකළ බවට සහතිකයක්,

නවක නිලධරයන් විසින් රාජකාරි භාරගෙන දින 14ක් ඇතුළත ගරු මහ ලේකම්වරයා හරහා විධායක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**14 වැනි රීතිය - නිලධරයන් තෝරා පත්කර ගැනීම**

(අ) සංගමයේ නිලධරයන් මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී තෝරා පත්කරගත යුතුය.

(ආ) නිලවරණය සඳහා වන නාම යෝජනා අදාළ අනුබද්ධිත සංගමය විසින් යෝජනා කර වෙනත් අනුබද්ධිත සංගමයක් විසින් සටිර කර මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය පැවැත්වීමට දින 21 පෙර ගරු මහ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සංස්ථාපිත සංගමයක යම් නාම යෝජනාවක් නියම කල්හි ස්වකීය අනුබද්ධිත සංගමයට ඉදිරිපත් කළ යුතුය. එවැනි නාම යෝජනාවක් 13 (ඈ) වගන්තියේ විධිවිධාන වලට අනුකූල වන්නේ නම්, අනුබද්ධිත සංගමය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට යටත් පිරිසෙයින් දින දාහතරකට (14) පෙර නාමයෝජනා ලැබිය යුතු බවට මහ ලේකම් විසින් සියලුම අනුබද්ධිත සංගම්වලට හා සංස්ථාපිත සංගම්වලට දැනුම් දිය යුතුය.

(ඉ) විධායක කමිටුව විසින්, මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට පෙර කල් ඇතිව සියලුම නාම යෝජනා සියුම් ලෙස පරීක්‍ෂා කළ යුතුය. විධායක කමිටුවට වලංගු හේතු දක්වා ඕනෑම නාම යෝජනාවක් ප්‍රතික්ෂේප කළ හැකිය. එවැනි ප්‍රතික්ෂේප කිරීමක දී අනුබද්ධිත සංගම් හරහා නාමිකයා දැනුවත් කළ යුතුය. එකඟතාවයක් නොමැති අවස්ථාවක දී විධායක කමිටුවේ තීරණය අවසාන තීරණය විය යුත්තේය.

**15 වැනි රීතිය - නිලධරයන්ගේ රාජකාරි, කාර්යයන් හා වගකීම්**

**නිලධාරීන්ගේ රාජකාරීන් පහත සඳහන් පරිදි විය යුතුය.**

**(අ) සභාපති**

**(1)** විධායක කමිටුව හා මහා මණ්ඩලය විසින් ගනු ලබන සියලුම තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේය.

**(2)** සංගමයේ ප්‍රධානියා වන අතර සියලුම රාජකාරි කටයුතුවලදී සංගමය උදෙසා සහ ඒ වෙනුවෙන් කටයුතු කළ යුතුය.

**(3)** සභාපති විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සහ විධායක කමිටුවේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා නොමැති අවස්ථාවක උප සභාපතිවරුන්ගෙන් කෙනෙක් මුලසුන දැරිය යුත්තේය. සභාපතිවරයා හා සියලුම උප

සභාපතිවරුන් නොපැමිණි අවස්ථාවක දී එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා රැස්වීමේ සාමාජිකයන් විසින් පැමිණ සිටින යම් විධායක කමිටු සාමාජිකයෙකු තෝරා පත්කර ගත යුතුය.

**(4)** ගෞරවය සහ යහපැවැත්ම පවත්වාගනිමින් සාධාරණ හා විනිවිද භාවයෙන් යුතුව අපක්ෂපාතී ආකාරයට සියලුම රැස්වීම් පැවැත්විය යුතුය.

**(5)** විධායක කමිටුවේ පසු අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය උදෙසා සහ ඒ වෙනුවෙන් ප්‍රකාශ නිකුත් කළ යුතුය.

**(6)** යටත් පිරිසෙයින් එක් අනුකමිටුවක හෝ මුලසුන දැරීමට එක් එක් උපසභාපතිවරු නම් කළ යුතු අතර විධිමත් පරිදි ඔවුන් කටයුතු කරන බවට සහතික විය යුතුය. 17 (ආ) (5) (අ) රීතියෙහි විධිවිධාන සලසා ඇති පරිදි පත් කරනු ලැබූ වෙනත් අනුකමිටුවල මූලාසනය දැරීම සඳහා ඔහු විසින් සුදුසු සාමාජිකයන් නම් කළ යුතුය.

**(7)** සියලුම නිල උත්සව අවස්ථාවලදී ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය නියෝජනය කළ යුතු අතර එසේ කිරීමට නොහැකි වන අවස්ථාවලදී එම කටයුතුවලට යථා පරිදි සහභාගී වීම සඳහා උපසභාපතිවරුන්ගෙන් කෙනෙකු නම් කළ යුතුය.

**(8)** ගරු මහ ලේකම්වරයාගේ සහ ගරු භාණ්ඩාගාරිකවරයාගේ කටයුතු අධීක්ෂණය කළ යුතු අතර ඔවුන් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පැවැත්ම හා ප්‍රගමනය සඳහා ස්වකීය කාර්ය හා කර්තව්‍යයන් ඉටු කරන බවට වග බලාගත යුතුය.

**(9)** සේවා මුක්ත භට සුභ සාධක සේවා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය නියෝජනය කිරීම සඳහා විධායක කමිටුවේ එකඟතාවය ඇතිව ස්වකීය අභිමතයෙන් විධායක කමිටු සාමාජිකයෙකු නම් කළ යුතුය.

**(10)** අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් හෝ නීති උපාධියක් ලබා ඇති නීතිඥවරයෙකු වන සේවාමුක්ත භටයෙකු සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රධාන නීති උපදේශක වශයෙන් නම් කළ යුතුය.

**(11)** ගිණුම් ක්ෂේත්‍රයෙහි ප්‍රවීණතාවයක් ඇති සේවා මුක්ත භටයෙකු මූල්‍ය උපදේශක වශයෙන් නම් කළ යුතුය.

**(ආ) උපසභාපතිවරු**

**(1)** සභාපතිවරයා නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් උපසභාපතිවරුන්ගෙන් කෙනෙක් ක්‍රියා කළ යුතු අතර රැස්වීම්වල මුලසුන දැරිය යුතුය.

**(2)** 15 (අ) (6) වැනි රීතියෙහි විධිවිධාන සලසා ඇති පරිදි යටත් පිරිසෙයින් සංගමයේ අනුකමිටුවලින් එකක මුලසුන දැරීම සඳහා උපසභාපතිවරුන්ගෙන් එක්කෙනෙක් බැගින් පත් කළ යුතුය. ඔවුන් ස්වකීය වාර්තා විධායක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**(ඈ) ගරු මහ ලේකම්**

**(1)** මහ ලේකම්වරයා විසින් සුදුසු න්‍යාය පත්‍රයක් සහිතව මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය, විශේෂ මහා මණ්ඩල සහ විධායක කමිටු රැස්වීම් සියල්ලම කැඳවීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

**(2)** මහ ලේකම්වරයා විසින් මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය, විශේෂ මහා මණ්ඩලය සහ විධායක කමිටුවේ වාර්තා සටහන්වල විධිමත් සහ සත්‍ය ලේඛන පවත්වාගෙන යා යුතුය. ඔහු විසින්, එම රැස්වීම් වාර්තා එකී රැස්වීම් පවත්වා මාස දෙකක් ඇතුළත සුදුසු පරිදි මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය, විශේෂ මහා මණ්ඩලය සහ විධායක කමිටුවේ සාමාජිකයන් අතර බෙදා හැරිය යුතුය.

**(3)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සියලුම ලිපි කටයුතු හා දෛනික කටයුතු පිළිබඳ අවධානය යොමුකර කටයුතු කළ යුතු අතර ලැබෙන සියලුම ලිපි සහ ලේඛන එළැඹෙන විධායක කමිටු රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතුය.

**(4)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය විසින් සේවයේ යොදවනු ලබන කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පවත්වාගෙන යා යුතු අතර ඔවුන්ට කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමට හැකි වන පරිදි රාජකාරී හා වගකීම් බෙදා වෙන් කළ යුතුය.

**(5)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අයත් සියලුම නිශ්චල සහ චංචල දේපළ විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුත්තේය.

**(6)** සාමාජිකත්වය සඳහා යොමු කරන සියලුම අයදුම්පත් විධිමත්ව පරීක්ෂාකර බැලීම සහ නිර්දේශ ලබාගැනීම සඳහා සාමාජිකත්ව ඇගයීම් කමිටුව වෙත ප්‍රමාදයකින් තොරව ඉදිරි පත් කළ යුතුය. අනතුරුව එම අයදුම්පත්‍ර අනුමැතිය/සහතික කිරීම සඳහා විධායක කමිටුව වෙත යොමු කළ යුතුය.

**(7)** අනුබද්ධිත සංගමයක යම් එක් එක් සාමාජිකයෙකු විසින් 7 (ආ) හා (ඇ) රීතිවල යම් උල්ලංඝනය කිරීමක් පිළිබඳව සාමාජික ඇගයීම් කමිටුව වෙත යොමු කළ යුතුය. එවැනි උල්ලංඝනය කිරීමක් ඔප්පු වුවහොත් විධායක කමිටුව විසින් එසේ නුසුදුසු වූ

සාමාජිකයාගේ සාමාජිකත්වය ස්වකීය සංගමයෙන් ඉවත් කරන ලෙස එම සාමාජිකයාගේ සංගමයට නිර්දේශ කළ යුතුය.

**(8)** ගරු මහ ලේකම්වරයා විසින් 19 (අ) (1) රීතිය මගින් නියම කර ඇති පරිදි සෑම වර්ෂයකම අප්‍රේල් 30 වැනි දිනට පෙර පැවැත්විය යුතු මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට යටත් පිරිසෙයින් මසකට පෙර විධායක කමිටුවේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

**(9)** මහ ලේකම් නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා උප ලේකම්වරුන්ගෙන් කෙනෙක් නම් කළ යුතුය.

**(ඈ) ගරු උපලේකම්වරු**

**(1)** ගරු උපලේකම්වරු විසින් තමන් වෙත පවරනු ලබන සියලුම කාර්ය හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් ගරු මහ ලේකම්වරයාට සහය දැක්විය යුතුය.

**(2)** සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව ගරු මහ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උප ලේකම්වරුන්ගෙන් කෙනෙක් ගරු මහ ලේකම්වරයා නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් ක්‍රියා කළ යුතුය.

**(3)** සභාපතිවරයා විසින් 24 (උ) රීතියෙහි සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකාර මණ්ඩලයේ ගරු ලේකම් ලෙස උපලේකම්වරුන්ගෙන් කෙනෙක් පත් කළ යුතුය.

**(ඉ) ගරු භාණ්ඩාගාරික**

**(1)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගිණුම් විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතුය. ඔහු විසින් පෙර මාසයේ ගිණුම් ප්‍රකාශනය මාසිකව අනුමැතිය සඳහා විධායක කමිටු රැස්වීම වෙත ඉදිරිපත් කළ යුතුය.

**(2)** භාණ්ඩාගාරික ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අයත් සියලුම අරමුදල්වල භාරකරුවා විය යුතු අතර විධායක කමිටුව විසින් නියම කර ඇති පරිදි මහා මණ්ඩලය විසින් සඳහන් කර ඇති ප්‍රතිපත්ති ප්‍රකාරව ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් හී යුද්ධයෙන් මියගියවුන් සිහිකිරීමේ දිනය හා පොපි මල් දිනය/යුද්ධ දයානුග්‍රහ අරමුදල ඇතුළුව එවැනි සියලුම අරමුදල් පරිපාලනය කළ යුතුය.

**(3)** 23 (ඊ) රීතිය මගින් නියම කර ඇති පරිදි සභාපති හෝ උපසභාපතිවරුන්ගෙන් කෙනෙක් හෝ ගරු මහ ලේකම්වරයා යන අය අතුරින් එක් නිලධරයෙක් සමඟ ශ්‍රී

ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය වෙනුවෙන් සියලුම චෙක්පත්වලට අත්සන් තැබිය යුතුය.

(4) පිළිගත් ගිණුම් ප්‍රමිතීන් හා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අනුව ආදායම් හා වියදම්වලට අදාළ සියලුම ගෙවීම්, ලැබීම් සහ ප්‍රතිපූර්ණය කිරීම් පිළිබඳ විධිමත් හා නිවැරදි වාර්තා පවත්වාගෙන යා යුතුය.

(5) විගණකවරුන් විසින් විධිමත්ව සකස්කර විගණනය කරන ලද අවසන් වාර්තාව සහිත ශේෂ පත්‍රය හා ගිණුම් , සෑම වර්ෂයකම අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පවත්වනු ලබන මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී මහා මණ්ඩලය විසින් සම්මත කරගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(6) අවශ්‍ය අවස්ථාවලදී ඉල්ලා සිටින විට අදාළ ගිණුම් පොත්, වාර්තා සහ ලේඛන විගණකවරුන් වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) ඉල්ලා සිටින විට අදාළ ගිණුම් පොත්, වාර්තා සහ ලේඛන අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

(8) ගරු භාණ්ඩාගාරික විසින් ගරු සභාපති, ගරු මහ ලේකම් හා මුදල්, අයවැය හා සැලසුම් අනුකමිටුවේ උපදෙස් පරිදි සෑම වර්ෂයකම ඔක්තෝබර් 31 දින හෝ ඊට පෙර සංගමයේ වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

(9) එසේ සකස් කරන ලද වාර්ෂික අයවැය ලේඛනය සෑම වර්ෂයකම නොවැම්බර් මාසයේ දී විධායක කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

(10) විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබූ වාර්ෂික අයවැය ලේඛනය සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දින හෝ ඊට පෙර භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(11) ගිණුම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සෑම කාර්තුවකට වරක්ම ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකරුවන් වෙත ඉදිරිපත් කළ යුතුය.

(12) අවශ්‍යනම් නිල බලයෙන් පත් වන සාමාජිකයෙක් වශයෙන් විධායක කමිටුව විසින් පත්කරනු ලබන අනුකමිටු සඳහා ඇතුළත් කර ගත යුතුය.

(13) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සියලුම දේපළ පිළිබඳ දේපළ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර යම් වෙනස් කිරීමක් පිළිබඳ විධායක කමිටුව හරහා භාරකරුවන් වෙත දැනුම් දිය යුතුය.

**(14)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සියලු චංචල හා නිශ්චල දේපළ පිළිබඳ භාණ්ඩ ලේඛනයක් භාරකාර මණ්ඩලය වෙත ලබාදිය යුතුය.

**(15)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අයත් දේපළ විධායක කමිටුවේ අවසරයකින් තොරව බැහැර නොකරන බවට තහවුරු කළ යුතුය. රුපියල් ලක්ෂ පහක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් දේපළ භාරකාර මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ඇතිව පමණක් මිලදී ගැනීම, බදු දීම හෝ විකිණීම කළ හැකිය.

**(16)** භාණ්ඩාගාරික විසින්, ඉල්ලා සිටින විට කිසියම් කරුණක් පිළිබඳ යම් තොරතුරු සැපයීම හෝ ඕනෑම ලේඛනයක් ඉදිරිපත් කිරීම වැනි ස්වකීය රාජකාරි ඉටුකිරීමේ දී සෑම ආකාරයකින්ම භාරකාර මණ්ඩලය වෙත සහයෝගය දක්වමින් උපකාර කළ යුතුය.

**(17)** භාණ්ඩාගාරික විසින් ස්වකීය දැඩි අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතු ගරු උප භාණ්ඩාගාරිකට අවශ්‍ය විය හැකි යම් බලයක් සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව පවරා දිය හැකිය.

**(18)** ගරු භාණ්ඩාගාරික භාරකාර මණ්ඩල රැස්වීම්වලට සහභාගි විය යුතුය.

**ඊ. ගරු උපභාණ්ඩාගාරික**

ගරු උපභාණ්ඩාගාරික විසින් තමන් වෙත පවරනු ලබන කාර්ය හා කර්තව්‍යයන්හිදී භාණ්ඩාගාරික හට සහාය විය යුතු අතර ගරු භාණ්ඩාගාරික නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් ක්‍රියා කළ යුතුය.

**16 වැනි රීතිය - මහා මණ්ඩලය**

අ. සංයුතිය - මහා මණ්ඩලය සමන්විත වන්නේ :-

**(1)** අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම් විසින් වාර්ෂිකව නම්කරනු ලබන නියෝජිතයන් පහත සඳහන් පරිදි වේ :-

(අ) අවම සාමාජිකත්වය 100ක් සිටින අනුබද්ධිත සංගම්වලින් - නියෝජිතයින් 05

(ආ) ඉන් අනතුරුව, වැඩිවන සෑම සාමාජිකයන් 100 දෙනෙකුට, උපරිම සාමාජිකයන් සංඛ්‍යාව 25 කට යටත්ව අතිරේක සාමාජිකයන් දෙදෙනෙකු (02) නම් කිරීමට එක් එක් අනුබද්ධිත සංගමයට හිමිකමක් ඇත්තේය.

(ඇ) සංස්ථාපිත සංගම් - උපරිම නියෝජිතයන් 02. ස්වකීය මව් සංගම් හරහා හැර, ඔවුන් නිලතල දැරීම සඳහා සෘජුවම නම් කළ නොහැකිය.

(ඈ) සේවා මුක්ත භටයෙක් අනුබද්ධිත සංගම් එකකට වඩා වැඩි ප්‍රමාණයක සාමාජිකයෙකු වන අවස්ථාවක දී, මහා මණ්ඩලයට එම අදාළ සංගම්වල නියෝජිතයන් සංඛ්‍යාව ගණනය කිරීමේ දී ඔහුගේ සාමාජිකත්වය ගණනය කළ යුත්තේ එම සංගම්වලින් එකකට නොවැඩි ප්‍රමාණයක් සැලකිල්ලට ගනිමින්ය.

උදා : ලුතිතන් (විශ්‍රාමික) ආර්පී, "$x$" නමැති මව් සංගමයේ සාමාජිකයෙකි. ඔහු “Y” නමැති සංගමයේ ද සාමාජිකයෙක් වෙයි. මහා මණ්ඩලයට නියෝජිතයන් සංඛ්‍යාව ගණනය කිරීමේ දී "$x$" නමැති මව් සංගමය පමණක් ගණනය කළ යුතුය.

(ඉ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකත්වය සඳහා අයදුම් කරන විට අනුබද්ධිත සංගම් එකකට වඩා වැඩි ප්‍රමාණයක සාමාජික්තවය දරන සාමාජිකයින්ගේ නම් සියලුම අනුබද්ධිත සංගම් විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(ඊ) අනුබද්ධිත සංගමයක සාමාජිකත්වය සඳහා අයදුම් කරන සේවා මුක්ත භටයෙක් විසින් වෙනත් අනුබද්ධිත සංගම්වල ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය පිළිබඳව තම අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

(උ) යම් සංගමයක සාමාජිකත්වය ලැබීමෙන් පසුව වෙනත් සංගමයකටද සම්බන්ධ විමට ඔහු/ඇය තීරණය කරයි නම් වෙනත් අනුබද්ධිත සංගම්වල ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය පිළිබඳව ප්‍රකාශයට පත් කිරීම සෑම සේවා මුක්ත භටයෙකුගේම වගකීම විය යුත්තේය.

**ආ. මහා මණ්ඩලයේ රාජකාරි හා වගකීම්**

(1) මහා මණ්ඩලය විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ නිලධරයන් තෝරා පත් කර ගත යුතුය.

(2) (අ) අනුබද්ධිත සංගම් විසින් මහා මණ්ඩලයට සහ විධායක කමිටුවට ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා මහා මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වන නියෝජිතයින් වෙනස් කිරීම සම්බන්ධයෙන් අනුබද්ධිත සංගමය විසින් වාර්ෂික මහා සභා රැස්වීමට දින හතකට (07) පෙර විධායක කමිටුවට දැනුම් දෙන්නේ නම් පමණක් ප්‍රතියුක්තයට අවසර දිය යුතුය.

(3) මෙම රීතිවල 26 වැනි රීතිය යටතේ විධිවිධාන සලසා ඇති පරිදි යම් රීතියක් සෑදීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ජින්න කිරීම කළ යුතුය.

(4) විධායක කමිටුව විසින් ගනු ලබන යම් යම් තීරණ, අවශ්‍ය නම් සමාලෝචනය කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම.

(5) විධායක කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පොදු ප්‍රතිපත්ති යෝජනා සම්මත කර ගැනීම.

(6) ඊළඟ වර්ෂය සඳහා විගණකවරුන් පත් කිරීම.

**17 වැනි රීතිය - විධායක කමිටුව**

**අ. සංයුතිය**

විධායක කමිටුව පහත සඳහන් නිලධරයන්ගෙන් සමන්විත විය යුතුය.

**(1)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ නිලධරයන්

**(2)** හිටපු ආසන්නතම සභාපතිවරයා

**(3)** ප්‍රධාන නීති උපදේශක - සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකයන් අතරින් නම් කරනු ලබයි. ඔහුට/ඇයට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත්තේය.

**(4)** මූල්‍ය උපදේශක - සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකයන් අතරින් නම් කරනු ලබයි. ඔහුට/ඇයට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත්තේය.

**(5)** අනුබද්ධිත සංගම් විසින් වාර්ෂිකව නම් කරනු ලබන නියෝජිතයන් - මෙහි මින්මතු නම් කරන ලද සාමාජිකයන් ලෙස හඳුන්වන - පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| **(i)** | සාමාජිකත්වය 250 ක් හෝ ඊට අඩු සංගමයක් | - සාමාජිකයින් 01 |
| **(ii)** | සාමාජිකත්වය 251 සිට 1000 දක්වා ඇති සංගමයක් | - සාමාජිකයින් 02 |
| **(iii)** | සාමාජිකත්වය 1001 ක් හෝ ඊට වැඩි සංගමයක් | - සාමාජිකයින් 03 |

කෙසේ වුව ද ඉහත 16 අ (1) රීතිය යටතේ මහා මණ්ඩලයට නම් කරන ලද තැනැත්තන් අතරින් මෙම නාම යෝජනා සිදුකරනු ලැබේ.

**(6)** යුද, නාවික හා ගුවන් හමුදාපතිවරුන් විසින් නම් කරනු ලබන ත්‍රිවිධ හමුදාවේ එක් එක් නියෝජිතයෙක්. ඔවුන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොතිබිය යුතුය.

**(7)** දැනටමත් හඳුනාගෙන ඇති සංස්ථාපිත සංගම්වලට අගතියක් නොවන පරිදි සාමාජිකත්වය 100ක් හෝ ඊට වැඩි සංස්ථාපිත සංගම් - සාමාජිකයින් - 01

**ආ. රාජකාරි සහ වගකීම්**

විධායක කමිටුවේ රාජකාරි සහ වගකීම් පහත සඳහන් පරිදි වේ.

**(1)** මහා මණ්ඩලය විසින් නියම කරනු ලබන මෙම රීති සහ පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ කටයුතුවල විධායක පාලනය සම්බන්ධයෙන් විධායක කමිටුව වගකිව යුත්තේය.

**(2)** මෙම රීති මගින් නියම කර ඇති සියලුම රාජකාරිවල කාර්ය සාධනය.

**(3)** 25 වැනි රීතිය ප්‍රකාරව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගම් ආයතනයට භාරකරුවන් 4 දෙනෙකු තෝරා පත් කිරීම.

**(4)** විධායක කමිටුව විසින් තීරණය කරන ලද පරිදි අතිශයින් වැදගත්, ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක විය යුතු හදිසි කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඕනෑම අවස්ථාවක දී විධායක කමිටුවට මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක.

**(5)** (අ) නිලවරණයෙන් අනතුරුව ප්‍රථම රැස්වීමේදී පහත සඳහන් අනුකමිටු පත් කරගත යුත්තේය.

1. ලේඛනාරක්ෂක
2. විගණන
3. මූල්‍ය අයවැය සහ සැලසුම්
4. ඉඩම් සහ නිවාස
5. මාධ්‍ය සහ ප්‍රචාරණය
6. සාමාජිකත්ව ඇගයීම
7. වෛද්‍යාධාර
8. සන්නද්ධ හමුදා අනුස්මරණ දින (පොපි)
9. පුනරුත්ථාපනය සහ නැවත පදිංචි කිරීම
10. රීති සහ සම්ප්‍රදායයන්
11. ශිෂ්‍යත්ව ප්‍රදාන

12. තාක්ෂණික ඇගයීම්

13. ප්‍රවීණ රණවිරු නිවාසය

14. සුභ සාධනය

15. තොරතුරු තාක්ෂණය

16. නිවාඩු නිකේතන

17. ප්‍රතිපත්ති සැලසුම් සහ ක්‍රම සම්පාදනය

ආ. වරින්වර අවශ්‍ය විය හැකි පරිදි විධායක කමිටුවට වෙනත් යම් අනුකමිටුවක්/කමිටු පත් කළ හැකිය.

ඇ. අනුකමිටු සභාපතිවරුන්ට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යම් සාමාජිකයෙක් සුදුසු යැයි සලකනු ලබන්නේ නම් අමතරව එකතු කර ගැනීමට බලය ඇත්තේය.

ඈ. සභාපතිවරයා විසින් නිර්ණය කරනු ලබන කාලරාමුවක් තුළදී අනුකමිටු සභාපතිවරුන් විසින් ස්වකීය වාර්තා හා නිර්දේශ විධායක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**(6)** 23 (ආ) (1) (2) (3) (4) (5) සහ (6) රීතීන් හී ඕනෑම අරමුදලකින් සහ වරින්වර විවෘත කරනු ලබන වෙනත් යම් ගිණුම්වලින් සිදුකරනු ලබන සියලුම ගෙවීම් විධායක කමිටුව විසින් අනුමත කළ යුතුය.

**(7)** සංගමයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා අනුස්මරණ දින හා පොපි අරමුදල දැනට යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලේ සියලු එක්රැස් කිරීම් සහ විධිමත්ව වියදම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේය.

**(8)** යම් ව්‍යාපෘතියකට පුළුල් ආයෝජනය කිරීම සහ රුපියල් 500000/- ක් (රුපියල් ලක්ෂ පහ) ක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් නිශ්චල හෝ චංචල දේපළක් මිලදී ගැනීම, විකිණීම හෝ බදු දීම භාරකාර මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව පමණක් සිදුකළ යුතුය.

**(9)** අනුකමිටු වාර්තා සලකා බැලිය යුතු අතර, නිර්දේශිත ක්‍රියා මාර්ග සහතික කළ යුතුය. ඒ අනුව ඒවා ක්‍රියාවට නැංවිය යුතුය.

**(10)** ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුවේ සාමාජිකයන් වශයෙන් සෑම අවස්ථාවේදීම ගෞරවාන්විතව හා විනීතව හැසිරිය යුතුය.

**18 වැනි රීතිය - මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ සහ විධායක කමිටුවේ පුරප්පාඩු**

මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ සහ විධායක කමිටුවේ ඇතිවන පුරප්පාඩු මහා මණ්ඩලයේ ඊළඟ වාර්ෂික මහා සභාව වන තුරු පහත සඳහන් පරිදි පිරවිය යුතුය.

අ. නම් කරන ලද සාමාජිකයන් - විධායක කමිටුව මගින් සහතික කිරීමට යටත්ව අදාළ අනුබද්ධිත සංගම්වල නාම යෝජනා මගින්

ආ. අනෙකුත් පුරප්පාඩු -විධායක කමිටුව මගින්

**19 වැනි රීතිය - රැස්වීම්**

අ. මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය

(1) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් රැස්විය යුතුය. එක් එක් වර්ෂයේ ජනවාරි 1 වැනි දිනට පසු එහෙත් අප්‍රේල් 30 වැනි දින නොඉක්මවන දිනයක හැකි ඉක්මනින් එම මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය පැවැත්විය යුතුය.

(2) විධායක කමිටුව විසින් තෝරාගනු ලබන අවම වශයෙන් ජාතික පුවත් පත් දෙකක් මගින් මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ එවැනි රැස්වීමක් පිළිබඳ අනුබද්ධිත සංගම්වලට සහ සංස්ථාපිත සංගම්වලට යටත් පිරිසෙයින් දින 28කට කලින් දැනුම් දිය යුතුය.

(3) පැමිණීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම

- **(i)** අනුබද්ධිත සංගම්වල බලය ලත් නියෝජිතයන්ට පමණක් මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.
- **(ii)** රහස් ඡන්ද පත්‍රිකාවක් මඟින් ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

(4) විධායක කමිටු වාර්තාව සහ විගණනය කරනු ලැබූ පෙර මුදල් වර්ෂයේ ගිණුම් ප්‍රකාශනය යෝජනා සම්මත කිරීම සඳහා මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

(5) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය විසින්,

- **(i)** 14 වැනි රීතියේ විධි විධාන සලසා ඇති පරිදි නිලධරයන් තෝරා පත් කර ගැනීම.
- **(ii)** පවත්නා වර්ෂය සඳහා විගණකවරුන් තෝරා පත්කර ගැනීම කළ යුතුය.

(6) **(i)** විධායක කමිටුව විසින් සභාපතිවරයාගේ නිර්දේශය මත ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකාර මණ්ඩලයේ ගරු ලේකම්වරයා වශයෙන් උපලේකම්වරුන්ගෙන් එක් අයෙකු නම් කළ යුතුය.

**(ii)** සභාපතිවරයාගේ නිර්දේශය මත ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකයන් අතරින් ප්‍රධාන නීති උපදේශක සහ මූල්‍ය උපදේශක පත්කර ගත යුතුය.

(අ) මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීම

**(1)** 17 ආ (4) රීතියෙහි දක්වා ඇති පරිදි විධායක කමිටුව විසින් මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකිය.

**(2)** ගරු මහ ලේකම්වරයා විසින් අනුබද්ධිත සංගම් හා සංස්ථාපිත සංගම් යටත් පිරිසෙයින් තුනෙන් එකක (1/3) සංඛ්‍යාවකගෙන් හෝ මහා මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් (1/3) ලැබෙන ඉල්ලීමක් ලද දින සිට දින 28 ක් ඇතුළත මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය. එවැනි ඉල්ලීම් ලිඛිතව සිදුකළ යුතු අතර එවැනි විශේෂ මහා සභා රැස්වීමක දී සාකච්ඡා කළ යුතු කරුණ/ කරුණු විශේෂයෙන් සඳහන් කළ යුතුය.

**(3)** මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක් පිළිබඳ දැන්වීම යටත් පිරිසෙයින් දින 14 කට කලින් අනුබද්ධිත සංගම්වලට හා සංස්ථාපිත සංගම්වලට ලිඛිතවම ලබාදිය යුතුවේ. ඉහත 19 වැනි රීතියේ දක්වා ඇති පරිදි එවැනි දැන්වීමක් ජාතික පුවත්පත් දෙකකින් ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

**(4)** එවැනි විශේෂ මහා සභා රැස්වීමක න්‍යාය පත්‍රය එවැනි රැස්වීමකට යටත් පිරිසෙයින් දින 21 කට කලින් මහා මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත ලැබෙන පරිදි ලිඛිතව දැනුම් දිය යුතුය. එවැනි නිවේදනයක් ඔවුන් සාමාජිකත්වය දරන අනුබද්ධිත සංගම් මඟින් සාමාජිකයන් වෙත නිකුත් කළ යුතුය.

**(5)** එවැනි විශේෂ මහා සභා රැස්වීමක න්‍යාය පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාර්යයන් හැර වෙනත් කිසිම කාර්යයක් සම්බන්ධයෙන් එවැනි රැස්වීමකදී කටයුතු නොකළ යුතුය.

ඇ. විධායක කමිටු රැස්වීම්

ලිත් වර්ෂයකට විධායක කමිටු රැස්වීම් සංඛ්‍යාව දහයකට (10) නොඅඩු විය යුතුය.

ඈ. සාමාන්‍ය විධිවිධාන - රැස්වීම්වලට නොපැමිණීම

**(1)** සාමාජිකයෙකු වලංගු හේතුවක් නොමැතිව අනුගාමී විධායක කමිටු රැස්වීම් තුනකට සහභාගී නොවන සාමාජිකයෙකුගේ විධායක කමිටු සාමාජිකත්වය අවසන් විය යුතුය.

(2) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගරු මහ ලේකම්වරයා විසින් එවැනි සාමාජිකයෙකු පිළිබඳ ඔහුගේ අනුබද්ධිත සංගමයට හෝ සංස්ථාපිත සංගමයට වාර්තා කරනු ලබන අතර ඔහුගේ සාමාජිකත්වය අවසන් කළ දින සිට වසර දෙකක කාල පරිච්ඡේදයක් යන තුරු විධායක කමිටුවට එම සාමාජිකයා නැවත නම් නොකළ යුතුය.

**20 වැනි රීතිය - පෙරකලාසිකරු (ප්‍රතියුත්තකරු)**

නම් කරනු ලැබූ සාමාජිකයන් විසින් විධායක කමිටුව තුළ අනුබද්ධිත සංගම්/සංස්ථාපිත සංගම් නියෝජනය කරන අතර එවැනි නම් කරන ලද යම් සාමාජිකයෙකුට විධායක කමිටු රැස්වීමට සහභාගි වීමට නොහැකි වන අවස්ථාවක දී ඔහුගේ සංගමයේ සභාපති/ලේකම් විසින් යථා පරිදි බලය පැවරූ සංගමයේ සාමාජිකයෙකු (ප්‍රතියුක්තකරු), ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගරු මහ ලේකම්වරයාගේ එකඟතාවය ඇතිව එවැනි විධායක කමිටු රැස්වීමක දී නම් කරනු ලැබූ සාමාජිකයා නියෝජනය කිරීමට අවසර දිය යුතුය. ඔහුට එම රැස්වීමේ දී එම නම් කරනු ලැබූ නිලධාරියා විසින් විධායක කමිටුවේ දරනු ලැබූ සියලුම බලතල තිබිය යුත්තේය.

**21 වැනි රීතිය - යෝජනා ඉදිරිපත් කිරීම.**

(අ) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී අවධානයට ලක්කිරීමට අවශ්‍ය වන යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන මහා මණ්ඩලයේ යම් සාමාජිකයෙකු, එම යෝජනාව පිළිබඳව දින විසි එකකට (21) කලින් ඔහු සාමාජිකත්වය දරන අනුබද්ධිත සංගමය හරහා සංගමයේ ගරු මහ ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දීමෙන් එම යෝජනාව ඉදිරිපත් කළ යුතුය. එවැනි යෝජනාවක් යථා පරිදි ස්ථිර කර තිබිය යුතුය.

(ආ) යෝජනාවක් පිළිබඳ දැනුම්දීමක් කරන මහා මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන යම් සාමාජිකයෙකුට, මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය පවත්වන දිනට දින දහහතරකට (14) පෙර ඔහුගේ හෝ ඇයගේ අනුබද්ධිත සංගමය හරහා මහ ලේකම්වරයා වෙත එම යෝජනාව ඉදිරිපත් කර මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී එම යෝජනාව ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

(ඇ) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයක් හෝ මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක් මඟින් සම්මත කරනු ලබන යම් අභියෝජනාවක් මහා මණ්ඩලය විසින් සම්මත කළ වහාම හෝ දක්වා ඇති දිනයේ සිට ක්‍රියාත්මක විය යුත්තේය.

**22 වැනි රීතිය - ගණපූර්ණය**

(අ) මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය සඳහා ගණපූර්ණය, සහභාගිවීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(ආ) විශේෂ මහා සභා රැස්වීමක් සඳහා ගණපූර්ණය, සහභාගිවීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(ඇ) විධායක කමිටු රැස්වීමක් සඳහා ගණපූර්ණය, සහභාගිවීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසු විධායක කමිටු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(ඈ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකාර මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූර්ණය, තිදෙනෙක් විය යුතු අතර ඊට නිල බලයෙන් පත්වන සාමාජිකයන් ඇතුළත් නොවිය යුතුය.

# 4 වැනි කොටස
# මුදල් හා ගිණුම්

<u>**23 වැනි රීතිය මුදල් හා ගිණුම්**</u>

(අ) මුදල් වර්ෂය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මුදල් වර්ෂය සෑම වර්ෂයකම ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

(ආ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය විසින් පහත දක්වා ඇති ගිණුම් පවත්වාගෙන යා යුතුය.

(1) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගිණුම

(2) සන්නද්ධ හමුදා සිහිකිරීමේ දින අරමුදල / යුද්ධ දයානුග්‍රහ අරමුදල

(3) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යහ සාධක භාරකාර අරමුදල

(4) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණ රණවිරු නිවාස භාරකාර අරමුදල

(5) රාජකීය පොදු රාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත ලීගයේ ගිණුම (R.C.E.L.)

(6) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධක පහසුකම් සංවර්ධන අරමුදල

(ඇ) විධායක කමිටුවට වරින් වර අවශ්‍ය වන පරිදි නව ගිණුම් ආරම්භ කළ හැකිය. මෙම ගිණුම් විධිමත්ව මෙහෙයවීම සඳහා රීති සහ ක්‍රියාපටිපාටි ලේඛනගත කර මෙම රීතිවල උපලේඛන වශයෙන් ඇතුළත් කළ යුතුය. මෙම නව ගිණුම් සහ ඒවායේ රීති සහ ක්‍රියාපටිපාටි මහා මණ්ඩලයේ සහතික කිරීමට යටත් විය යුතුය.

(ඈ) සියලුම වියදම් අයවැයෙහි බලය ලබාදී ඇති මුදලට අනුකූලව සිදුවිය යුතු අතර එම මුදල ඉක්මවා නොයායුතුය. අයවැය මගින් වෙන්කර දී නොමැති, සිදුකිරීමට අපේක්ෂිත යම් වියදමක් සම්බන්ධයෙන් විධායක කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකරුවන් විසින් අනුමත කර ඇති පරිදි සිදුකළ යුතුය.

(ඉ) සියලුම ගෙවීම් විධායක කමිටුව විසින් අනුමත කළ යුතුය.

(ඊ) සියලුම චෙක්පත් ගරු භාණ්ඩාගාරික සහ පහත සඳහන් නිලධාරීන්ගෙන් එක් අයෙකු අත්සන් කළ යුතුය.

(1) සභාපති

(2) උපසභාපතිවරයෙක්

(3) ගරු මහ ලේකම්

(උ) අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර නොමැති හදිසි ගෙවීම් කිරීමට සිදුවන අවස්ථාවක, කාර්තුවක දී වරකට රු. 25,000/- බැගින් ගෙවීම් වාර හතරක් හෝ ඊට අඩු වෙන් ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව හෝ ඔහු නොමැති අවස්ථාවක උප සභාපතිවරුන්ගෙන් කෙනෙකු අනුමත කිරීමෙන් සිදුකළ හැකිය. එහෙත්, එවැනි ගෙවීමක් සිදුකළ වහාම විධායක කමිටුවේ රැස්වීමකදී ආවරණ අනුමැතිය ලබාගත යුතුය.

(ඌ) සංගමයේ සියලුම ගිණුම් මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීමට ප්‍රථම මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයකදී පත්කරනු ලැබූ විගණකවරුන් විසින් විගණනය කළ යුතුය.

# 5 වැනි කොටස
# භාරකරුවන්

**<u>24 වැනි රීතිය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ භාරකරුවන්</u>**

(අ) සංගමයේ සියලු අරමුදල් හා දේපළ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට භාරකාර මණ්ඩලයක් තිබිය යුත්තේය.

(ආ) භාරකාර මණ්ඩලය, මහා මණ්ඩලය විසින් තෝරා පත් කරගත යුතු හතර දෙනෙකුගෙන් සහ එක් එක් සේවාවන් නියෝජනය කිරීම සඳහා යුද්ධ, නාවික සහ ගුවන් හමුදාධිපතිවරුන් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලයන් සහිත සේවයේ නියුතු නිලධාරීන් තුන් දෙනෙකුගෙන් යුත් සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

(ඇ) තෝරා පත් කරගනු ලබන භාරකරුවන් පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුත්තේය.

(1) එක් එක් සේවාවෙන් යටත් පිරිසෙයින් එක් භාරකරුවෙක්වත් සිටිය යුතුය.

(2) ඔවුන් යටත් පිරිසෙයින් වසර තුනක් විධායක කමිටුවේ සාමාජිකයින් වී සිටිය යුතු අතර අදාළ ස්වකීය සංගමයේ ප්‍රධාන නිලධරයෙක්ද විය යුතුය.

(3) තෝරා පත්කරගනු ලබන සියලුම භාරකරුවන් වසර 3ක් ධූරය දැරිය යුතුය.

(4) භාරකරුවෙකු අනුගාමී වාර 02 ක් සේවය නොකළ යුතුය.

(5) භාරකරුවෙකු වශයෙන් තෝරා පත් කරනු ලබන සාමාජිකයෙකුට විධායක කමිටුවේ සාමාජිකයෙකු විය නොහැකි අතර, විධායක කමිටුවේ සාමාජිකයෙකුට භාරකරුවෙකු විය නොහැකිය. කෙසේවෙතත් ආරාධනාවක් මත ඔහුට සහභාගි විය හැක.

(6) අවංකභාවය ප්‍රත්‍යක්ෂ කරනු ලැබූ සහ නොකැළැල් වාර්තා සහිත සාමාජිකයන් භාරකරුවන් වශයෙන් නම් කළ යුතුය.

(ඈ) තෝරා පත් කරගනු ලබන භාරකරුවෙකුගේ ධූර කාලය අවසන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන පුරප්පාඩු වාර්ෂික සම්මේලනයේ දී පිරවිය යුතුය.

(ඉ) මරණයට පත්වීම, ආබාධිතවීම, ඉල්ලා අස්වීම, මාස තුනකට වැඩි කාල පරිච්ඡේදයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ විශ්වාසය නොමැතිවීම නිසා විධායක කමිටුව විසින් අස්කිරීම හේතුවෙන් භාරකාර මණ්ඩලයේ ඇතිවන පුරප්පාඩුවක්, එම භාරකරුගේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා 24 (ඇ) රීතියේ විධි විධානවලට යටත්ව සංගමයේ විධායක කමිටුව විසින් නම්කරනු ලබන තැනැත්තෙකුගෙන් පිරවිය යුතුය.

(ඊ) මහා මණ්ඩලය විසින්, මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී දැනටමත් ධූරය දරන තෝරා පත් කරගනු ලැබූ භාරකරුවන් අතරින් කෙනෙකු භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වාර්ෂිකව තෝරා පත් කරගත යුතුය.

(උ) සංගමයේ මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයෙන් පසු ප්‍රථම විධායක කමිටු රැස්වීමේදී සභාපතිවරයා විසින් සංගමයේ භාරකාර මණ්ඩලයේ ගරු ලේකම් ලෙස ගරු උප ලේකම්වරුන්ගෙන් කෙනෙක් නම් කළ යුතුය. එසේ නම්කරනු ලබන ලේකම්වරයාට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොතිබිය යුතුය.

(ඌ) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපති සහ/හෝ ගරු මහ ලේකම්වරයාට භාරකාර මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගී විය හැකි වුවද ඔහුට/ඇයට/ඔවුන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත්තේය. ගරු භාණ්ඩාගාරික රැස්වීම්වලට සහභාගී විය යුතු අතර විශේෂ තත්ත්වයකදී උපභාණ්ඩාගාරික විසින් ඔහුව නියෝජනය කළ යුතුය.

(එ) භාරකාර මණ්ඩලය යටත් පිරිසෙයින් කාර්තුවකට වරක් රැස්විය යුතුය.

(ඒ) රු. 500,000/= හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු ව්‍යාපෘතියකට ආයෝජනය කිරීම, නිශ්චල හෝ චංචල දේපළක් මිලදී ගැනීම, විකිණීම හෝ බද්දට දීම භාරකාර මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව පමණක් සිදුකළ යුතුය.

(ඔ) භාරකාර මණ්ඩලය විසින්, 23 (ආ) රීතියෙහි දක්වා ඇති පරිදි, සංගමයේ සහ එහි පරිපාලිත ගිණුම් සියල්ලෙහිම ආදායම් හා වියදම් සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කළ යුතු අතර එවැනි ගිණුම්වලට අදාළ සියලුම රීතිවලට සහ රෙගුලාසිවලට අතිශයින්ම අනුකූලව කටයුතු කර ඇති බවට තහවුරු කළ යුතුය.

(ඕ) භාරකාර මණ්ඩලය විසින් මුදල් වර්ෂය ආරම්භවීමට පෙර විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබූ සංගමයේ වාර්ෂික අයවැය සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කළ යුතුය.

(ක) භාරකරුවන් විසින් සංගමයේ සියලුම නිශ්චල හා චංචල දේපළ සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කළ යුතුය. මේ සඳහා, ඔවුන් දැනට සිදුකරන මිලදී ගැනීම් ඇතුළුව සියලුම

මිලදී ගැනීම් ඉන්වෙන්ටරි ගතකර සහ සුදුසු ලෙජර්වලට ඇතුල් කර ඇති බවට තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය ඉන්වෙන්ටරිය සහ ලේඛන ගරු භාණ්ඩාගාරිකවරයාගෙන් ලබාගත යුතුය.

(ග) භාරකරුවන් විසින් කිසිම අරමුදලක් පරිපාලනය නොකළ යුතු නමුත් විධායක කමිටුව විසින් ගෙවීම් අනුමත කරනු ලබන බවට තහවුරු කළ යුතුය. අදාළ අරමුදලට විෂය වූ රෙගුලාසි සහ රීති ප්‍රකාරව භාරකරුවන් එසේ ක්‍රියාකරනු ලබන අතර යම් අනිසි කටයුතු පිළිබඳ විධායක කමිටුවට උපදෙස් ලබාදෙයි.

(ච) භාරකරුවන් ශ්‍රී ලංකා භාර ආඥා පනතේ විධිවිධානවලට යටත් විය යුත්තේය.

(ට) භාරකාර මණ්ඩලය ඔවුන් වෙත පවරන ලද රාජකාරි ඉටුකරනු ලබන බවට තහවුරු කිරීම භාරකාර මණ්ඩලයේ සභාපතිවරයාගේ වගකීම විය යුත්තේය.

(ඩ) භාරකාර මණ්ඩලය විසින් ගනු ලබන සියලුම තීරණ එවැනි තීරණයක් ගැනීමෙන් සති දෙකක් තුළ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපතිවරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

(ණ) ප්‍රධාන නීති උපදේශක සහ මූල්‍ය උපදේශක ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සහිතව භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් විය යුත්තේය.

**<u>25 වැනි රීතිය - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ ආයතනයේ භාරකරුවන්</u>**

(අ) විධායක කමිටුව විසින්, අනුබද්ධිත සංගම් සහ සංස්ථාපිත සංගම් මගින් ඉදිරිපත් කරන නම්වලින් සේවා තුනම නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ ආයතනයට භාරකරුවන් හතරදෙනෙකු තෝරා පත්කර ගත යුතුය.

(ආ) එසේ නම් කරන තැනැත්තන් මහා මණ්ඩලයේ සාමාජිකයන් විය යුතුය.

(ඇ) එක් සංගමයකින් එක් සාමාජිකයෙකුට වඩා තෝරා පත්කර නොගත යුතුය.

(ඈ) නිලවරණය රහස් ඡන්දයෙන් විය යුතුය.

(ඉ) එසේ පත්කරගනු ලබන භාරකරුවන්, වසර දෙකක කාලයක් සේවය කළ යුතු අතර, ස්වකීය අඛණ්ඩ සේවා කාලය වසර හතරකට නොවැඩි විය යුතුය යන කොන්දේසියට යටත්ව නැවත තෝරා පත්කරගැනීමට සුදුසුකම් ලබයි. ඉන් අනතුරුව, යටත් පිරිසෙයින් වසරක විරාමයකින් පසුව නැවත තෝරා පත් කරගැනීමට ඔවුන් සුදුසුකම් ලබයි.

(ඊ) වරක් තෝරා පත්කරගනු ලබන භාරකරුවෙකු භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක දක්වා ඇති වලංගු කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුවේ තුනෙන් දෙකක බහුතරයකින් පමණක් ඉවත් කරනු ලැබිය හැකිය.

(උ) එසේ පත්කරනු ලබන යම් භාරකරුවෙකු, මාස තුනක් ඉක්මවන කාල පරිච්ඡේදයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නේ නම් හෝ ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ භාරකරුවෙකු වශයෙන් ක්‍රියාකිරීමට නොහැකිව අශක්නුතාවට පත්වන්නේ නම් හෝ එවැනි භාරකරුවෙකු පත් කරනු ලබන තැනැත්තෙක් හෝ ආයතනයක් විසින් ස්වකීය හෝ එම ආයතනයේ අභිමතය පරිදි එවැනි පත් කිරීමක් අවලංගු කරන්නේ නම්, පුරප්පාඩුව පිරවීම සඳහා ඒ ආකාරයෙන්ම වෙනත් භාරකරුවෙකු පත් කළ යුතුය.

(ඌ) මහා මණ්ඩලයෙන් හෝ අදාළ අනුබද්ධිත සංගමයෙන් ඉවත්වන අවස්ථාවක ඔහු ඒනයින්ම, භාරකරුවෙකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට සුදුසුකම් නොලබන්නේය.

(එ) භාරකාර මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවකදී විධායක කමිටුව විසින්, මහා මණ්ඩලය නියෝජනය කරන එම අනුබද්ධිත සංගමයේ සාමාජිකයන් අතරින් එම පුරප්පාඩුව පිරවිය යුතුය. මුල් පත්කිරීමේ සිට ඉතිරි කාල පරිච්ඡේදය සඳහා පමණක් ඔහු ධූරය දැරිය යුත්තේය.

# 6 වැනි කොටස

**සංශෝධන / අත්හැරුණ කරුණු / අර්ථ නිරූපණ /පූර්වගාමිත්වය**

**26 වැනි රීතිය - සංශෝධන**

(අ) 1992 අංක 42 දරන පනතේ 3 වැනි වගන්තිය මගින් සංශෝධිත 1976 අංක 08 දරන පනතේ 5 වැනි වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී හෝ මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමකදී පැමිණ ඡන්දය දෙන්නාවූ සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක ඡන්දයකින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ඕනෑම රීතියක් වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට, පරිච්ඡින්න කිරීමට හෝ නව රීති සාදනු ලැබීමට හැකිවන්නේ ය.

(ආ) පහත 26 (ඈ) රීතියෙහි විධිවිධානවලට යටත්ව රීති වෙනස් කිරීමට, පරිච්ඡින්න කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ නව රීතියක් හඳුන්වාදීම සඳහා වන යම් යෝජනාවක් පිළිබඳ දැන්වීමක්, සංගමයේ යම් සාමාජිකයෙකු විසින් යථා පරිදි ස්ථිර කර මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය වෙත හෝ මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමකට යටත් පිරිසෙයින් දින 21කට පෙර ස්වකීය අනුබද්ධිත සංගමය හරහා ගරු මහ ලේකම්වරයා වෙත ලිඛිතව ලබාදිය යුතුය.

ඇ. ගරු මහා ලේකම්වරයා විසින් එවැනි යෝජනාවක් පිළිබඳ දැන්වීමක්, රැස්වීමට යටත් පිරිසෙයින් දින 14කට පෙර ස්වකීය අදාළ අනුබද්ධිත සංගම් සහ සංස්ථාපිත සංගම් හරහා මහා මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත ලිඛිතව ලබා දිය යුතු අතර මහා මණ්ඩල රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින 14කට පෙර මහා මණ්ඩලය අනුමත කරන ලද පුවත් පත් දෙකක එම දැන්වීම පළ කළ යුතුය.

ඈ. මෙම රීති සංශෝධනය කිරීම සඳහා යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ඕනෑම සාමාජිකයෙකු ඉහත 21ආ රීතියෙහි විධි විධාන සලසා ඇති පරිදි එවැනි යෝජනාවක් පිළිබඳ දැනුම් දීමක් කිරීමේදී අදාළ ස්වකීය සංගමය හරහා එසේ කළ යුතුය.

ඉ. 1976 අංක 8 දරන පනතේ හෝ 1992 අංක 42 දරන පනතේ යම් විධිවිධානයක් සහ දෙවැනි උපලේඛනය සංශෝධනය කිරීම සඳහා වන යම් යෝජනාවක්, මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී හෝ මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන්නාවූ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් අනුමත කළ පසු ආරක්ෂක අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනාව පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් සහ ඒ ආකාරයෙන්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු පමණක් බලාත්මක විය යුත්තේය.

**27 වැනි රීතිය - අත්හැරුණ කරුණු**

මෙම රීති මගින් විධිවිධාන සලසා නොමැති යම් කාරණාවක් සම්බන්ධයෙන් විධායක කමිටුව සමඟ සාකච්ඡා කළ යුතු අතර ඔවුන්ගේ තීරණය අවසානාත්මක වේ.

**28 වැනි රීතිය - අර්ථ නිරූපණය**

අ. "සේවා මුක්ත භටයා" යන පාඨය පුරුෂ හෝ ස්ත්‍රී සේවා මුක්ත තැනැත්තන්ට අදාළ විය යුතුය.

ආ. "සංගමය" යන්නෙන් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය අදහස් වේ.

ඇ. "සංස්ථාපිත සංගමය" යන්නෙන් විශේෂ අභිලාෂයන් අරමුණු කරමින් දිස්ත්‍රික්ක හෝ වෙනත් සංවිධාන තුළ හෝ පළාත් මට්ටමින් ත්‍රිවිධ හමුදා සේවා මුක්ත භටයන්ගෙන් සැදුම්ලත් සංවිධාන හා සේවා මුක්ත භටයන්ගේ අභිලාෂයන් නියෝජනය කරන්නාවූ සංවිධාන සහ ආයතන මේ නමින් අදහස් වේ.

ඈ. "නම් කරන ලද සාමාජිකයා" යන්නෙන් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධිත සංගමයක් හෝ සංස්ථාපිත සංගමයක් විසින් නම් කරනු ලැබූ සාමාජිකයෙක් අදහස් වේ.

ඉ. යුධ හමුදාවේ "රෙජිමේන්තු/බළකාය" යන්න, "අනුබද්ධිත සංගමය" යන පාඨය වෙනුවට භාවිතා කළ හැකිය.

ඊ. ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළව ''අංශය'' යන්නෙන් පුහුණුව ලත් පුද්ගලයන්ගෙන් සමන්විත වූ අංශ කිහිපයක් සම්බන්ධ වූ නිපුණතා සමූහයක් අදහස් කෙරේ.

උදා : ඉංජිනේරු අංශය - ශිල්පීන්, ඉන්දන කාර්මිකයන් යනාදිය

උ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළව "වෘත්තීය" යන්නෙන් පුහුණුව ලත් පුද්ගලයන්ගෙන් සමන්විත වූ වෘත්තීන් කිහිපයක් සම්බන්ධ නිපුණතාවලින් හෙබි සමූහයක් අදහස් වේ. උදා : සිවිල් ඉංජිනේරු වෘත්තිය - පෙදරේරු, වඩු කාර්මික, ජලනල කාර්මික, විදුලි කාර්මිකයින් යනාදිය.

ඌ. නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ පිළිවෙළින් ''අංශය'' හා '' වෘත්තිය '' යන පාඨ යුධ හමුදාවේ ''රෙජිමේන්තු / බළකාය'' යන පාඨය වෙනුවට භාවිතා කරනු ලබයි.

එ. "අනුබද්ධිත සංගමය" යන්නෙන් නාවික හමුදාවට අදාළව "අංශය" සහ ගුවන් හමුදාවට අදාළව "වෘත්තිය " යන පාඨ අදහස් වේ.

**29 වැනි රීතිය - පූර්වගාමීත්වය**

2012 ජනවාරි මස 29 වැනි දින මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමක දී සම්මත කර ඇති මෙම රීති මෙතෙක් බලාත්මකව පැවති සියලු රීති අභිභවනය කළ යුත්තේය.

## ඇමුණුම "අ"

2012 ජනවාරි 29 වැනි දිනට ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධිත සේවා මුක්ත භට සංගම්

1. ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උප සේවා සංගමය
2. ලංකා කාලතුවක්කු හමුදා සංගමය
3. ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු සංගමය
4. යුධ හමුදා සංඥා සංගමය
5. ශ්‍රී ලංකා පාබළ හමුදා සංගමය
6. ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බළකා සේවා මුක්ත භට සංගමය
7. ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බළකා සංගමය
8. රාජකීය යුධ හමුදා සේවා බළකා සේවා මුක්ත භට සංගමය
9. ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
10. ශ්‍රී ලංකා සේවා මුක්ත ගුවන් හමුදා සංගමය
11. සන්නද්ධ ප්‍රවීණයන්ගේ සංගමය
12. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය
13. ශ්‍රී ලංකා යුධ හමුදා යුධෝපකරණ සංගමය
14. මහනුවර සේවා මුක්ත භට සංගමය (යුද්ධ /නාවික /ගුවන් හමුදා)

**15.** ගැමුණු හේවා සේවා මුක්ත භට සංගමය

**16.** යුධ හමුදා පොලිස් ප්‍රවීණයන්ගේ සංගමය

**17.** ශ්‍රී ලංකා යුධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා මුක්ත භට සංගමය

**18.** ශ්‍රී ලංකා යුධ හමුදා කාන්තා සේවා මුක්ත භට සංගමය

**19.** ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු සේවා සංගමය

**20.** එක්ස් කමාන්ඩෝ සංගමය

**21.** දෙවන ලෝක යුධ ප්‍රවීණයින්ගේ සංගමය
**22.** ශ්‍රී ලංකා නාවික හමුදා කාන්තා සංගමය
**23.** ප්‍රවීණ නාවික හමුදා සංඥා සංගමය
**24.** ශ්‍රී ලංකා යුධ හමුදා පොදු සේවා රෙජිමේන්තු සංගමය
**25.** ගජබා ප්‍රවීණයන්ගේ සංගමය
**26.** ශ්‍රී ලංකා යුධ හමුදා පුරෝගාමී බළකා සංගමය
**27.** ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තු ආදි සාමාජිකයන්ගේ සංගමය
**28.** ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යුත් සහ සන්නිවේදන සේවා මුක්ත සංගමය
**29.** ශ්‍රී ලංකා යුධ හමුදා බුද්ධි බළකා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය
**30.** ශ්‍රී ලංකා රයිෆල් බළකා සේවා මුක්ත භට සංගමය
**31.** ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා සේවා මුක්ත භට සංගමය
**32.** ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සේවා මුක්ත භට සංගමය
**33.** විජයබාහු පාබළ රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය
**34.** ශ්‍රී ලංකා නාවික හමුදා සේවා මුක්ත සෞඛ්‍ය සේවා සංගමය
**35.** ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සැපයුම් සංගමය
**36.** නාවික සෙබළ ප්‍රවීණයන්ගේ සංගමය
**37.** ශ්‍රී ලංකා නාවික හමුදා සේවා මුක්ත සැපයුම් හා සේවා ප්‍රවීණයන්ගේ සංගමය
**38.** ශ්‍රී ලංකා යාන්ත්‍රික පාබළ සේවා මුක්ත භට සංගමය
**39.** ශ්‍රී ලංකා සේවා මුක්ත නාවික ඉංජිනේරු සංගමය
**40.** නාවික කිමිදුම්කරුවන්ගේ සංගමය
**41.** ත්‍රිකුණාමල දිස්ත්‍රික් සේවා මුක්ත භට සංගමය
**42.** ප්‍රවීණ නාවික යාත්‍රික සංගමය
**43.** ශ්‍රී ලංකා ගුවන් හමුදා බෝම්බ නිෂ්ක්‍රීය සේවා මුක්ත භට සංගමය
**44.** ශ්‍රී ලංකා ගුවන් හමුදා පොලිස් සේවා මුක්ත භට සංගමය

පරිවර්තනය සඳහා පාදක කරගත් ඉංග්‍රීසි භාෂාවෙන් පළ කළ රීති පොතෙහි මෙම අනුබද්ධිත සංගම් ඇතුළත් කර නොමැත. අනු අංක 38 සිට අනු අංක 44 දක්වා ඇති අනුබද්ධිත සංගම් වර්ෂ 2012 ජනවාරි 29 වන දිනට පසු අනුමත කරන ලද සංගම් බව සලකන්න.

ඇමුණුම “ආ”

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධ වීම සඳහා සුදුසු ශ්‍රී ලංකා නාවික හමුදාවේ අංශ

1. නාවික සෙබළ අංශය
2. යාත්‍රික අංශය
3. සැපයුම් අංශය
4. වෛද්‍ය අංශය
5. ඉංජිනේරු අංශය
6. විදුලි සහ විද්‍යුත් අංශය
7. සංඥා අංශය
8. නාවික විනයාරක්ෂක අංශය
9. වාදක අංශය

ඇමුණුම "ඇ"

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අනුබද්ධ වීම සඳහා සුදුසු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෘත්තීන්,

1. ගුවන්යානා ඉංජිනේරු
2. සාමාන්‍ය ඉංජිනේරු
3. සිවිල් ඉංජිනේරු
4. වෛද්‍ය
5. පරිපාලන
6. සැපයුම්
7. ගුවන් මෙහෙයුම්
8. ගුවන් හමුදා විනයාරක්ෂක
9. ගුවන් කාන්තා

## සමාප්තිය

බ්‍රිගේඩියර් රංජන් ද සිල්වා එල්.එල්.බී. විසින් සභාපතිත්වය දරන ලද රීති කමිටුව විසින් කෙටුම්පත් කරනු ලැබ සියලුම සංගම් හා සංස්ථාපිත සංගම්වලට ඉදිරිපත් කරනු ලැබූ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පාලනය කරන මෙම රීති, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් සහතික කර 2012 ජනවාරි 29 වැනි දින ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපති කපිතාන් පැට්‍රික් ජයසිංහ පීඑස්වී,සාවි විසින් සභාපතිත්වය දැරූ මහා මණ්ඩල සාමාජිකයන් 215ක් සහභාගී වූ විශේෂ මහා සභා රැස්වීමේ දී ඒකමතිකව සම්මත කරගන්නා ලදි.



බ්‍රිගේඩියර් කේ.ඒ. ඥානවීර යූඑස්පී

ගරු මහ ලේකම්, ශ්‍රීලසේමුභස

2012 ජනවාරි 30

# 1 වැනි උපලේඛනය

## <u>රීති සඳහා පසුව සිදු කරන ලද සංශෝධන</u>

සංශෝධනය (අතිරේක) - අංක 1  14වී රීතිය

සංගමයේ ප්‍රධාන නිලධරයන් වසර 3ක් ධූර දැරිය යුත්තේය. එහෙත් සුවිශේෂි අවස්ථාවක දී මෙම කාලසීමාවට පසුව ඔහුගේ/ඇයගේ සේවාව අවශ්‍ය වන බවට හැඟී යන්නේ නම්, ඔවුන්ගෙන් යම් කෙනෙකුට විධායක කමිටුව විසින් සේවා දිගුවක් ප්‍රදානය කළ හැක.

(2012 අප්‍රේල් 29 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී ඒකමතිකව සම්මත කරගන්නා ලදි.)

# <u>මහා මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා</u>

## <u>2 වැනි උපලේඛනය</u>

### යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල

**යෝජිත වෙනස් කිරීම - සන්නද්ධ සේවා අනුස්මරණ දින සහ පොපි අරමුදල**

**(2001 ජනවාරි 07 වැනි දින විශේෂ මහා සභා රැස්වීමේ දී අනුමත කරන ලදි .)**

1. පොපි ව්‍යාපෘතියෙන් එකතුවන මුදල් සහ එකී අරමුදලට පරිත්‍යාග හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලුම මුදල් භාරව සිටීම සහ එකතු කිරීම සහ වියදම් කිරීම සම්බන්ධයෙන් ගරු භාණ්ඩාගාරික විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව වෙත වගකීමට බැඳී සිටින්නේය.

2. **පොපි** දිනය හා අනුස්මරණ දිනය සම්බන්ධයෙන් සියලු කටයුතු පිළියෙල කිරීම සඳහා සංගමයේ විධායක කමිටුව විසින් වගකිව යුතු වන අතර ඒ සඳහා වන අවශ්‍ය බලය සංගමය සතු වේ.

3. අරමුදලින් කරනු ලබන සියලුම වියදම් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබිය යුතුය.

4. අරමුදලට අයත් සියලුම මුදල් රජයේ බැංකුවක හෝ ස්ටෑන්ඩඩ් චාටඩ් බැංකුවේ ඇති අරමුදලේ ගිණුමෙහි තැන්පත් කළ යුතුය.

5. අවශ්‍යතා ඇති වයස් ගත, බෙලහීන, අසාධ්‍ය හා අනාථ සේවා මුක්ත භටයන්ට, ඔවුන්ගේ ළඟම නෑයන්ට හා ආබාධිත භටයන්ට මුදලින් ආධාර, වෛද්‍යාධාර හා පෝෂ්‍යදායී ආහාර සැපයීමත් සාමාන්‍යයෙන් ඔවුන්ගේ සුභ සිද්ධිය තහවුරු කිරීමත් අරමුදලින් සිදුවිය යුතුය.

6. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදලින් නිකුත් කරනු ලබන චෙක්පත් අත්සන් කිරීම සඳහා සභාපතිවරයාට, උපසභාපතිවරයෙකුට (විධායක කමිටුව විසින් නම් කරනු ලබන), ගරු මහ ලේකම්වරයාට හා ගරු භාණ්ඩාගාරිකට බලය පවරනු ලබන අතර භාණ්ඩාගාරිකගේ හා ඉහත සඳහන් නිලධරයන්ගෙන් එක් තැනැත්තෙකුගේ අත්සන් ප්‍රමාණවත් වේ.

7. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ 26 වැනි රීතියෙහි සඳහන් ක්‍රියාපටිපාටිය මෙම රෙගුලාසිවලට සිදුකරන යම් සංශෝධන සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර ආරක්ෂක අමාත්‍යවරයා විසින් සහතික කිරීම සහ පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට යටත් විය යුතුය.

**සටහන**

ප්‍රායෝගික අරමුණු සඳහා මහජනතාවට යුද්ධ දයානුග්‍රහ අරමුදල වටහා ගැනීමට නොහැකි බැවින් සන්නද්ධ සේවා අනුස්මරණ දින අරමුදල යන නාමය අමාත්‍යවරයාගෙන් තීරණාත්මක සංශෝධනය ලැබෙන තෙක් භාවිතා කරනු ලැබේ.

## 3 වැනි උපලේඛනය

**සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යහ සාධක භාර අරමුදල**
**(යම් වෙනස් කිරීමක් සඳහා රීතියක් වශයෙන් පවතින කොන්දේසිවලට යටත්ව)**
**2001 ජනවාරි 07 වැනි දින විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත කරගන්නා ලදි.**

1. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යහ සාධක භාර අරමුදල වශයෙන් හඳුන්වනු ලබන අරමුදලට ලැබෙන සියලුම මුදල් මෙම ගිණුමට බැර කළ යුතු අතර භාවිතා නොකළ යුතුය.

2. යහ සාධක භාර අරමුදලට ලැබෙන සියලුම මුදල් මෙම ගිණුමට බැර කළ යුතු අතර ප්‍රාග්ධනයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

3. ශ්‍රී ලංකා රජයේ වගකීමක් සහිත යෝජිත වැඩපිළිවෙළකට පමණක් මෙම අරමුදල ආයෝජනය කළ යුතුය.

4. අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායම පහත දක්වා ඇති අරමුණු සඳහා පමණක් භාවිතා කළ යුතුය.

   අ. සංගමයේ සාමාජිකයන් වන සේවා මුක්ත භටයන්ට සහ ඔවුන්ගේ ලැබීමට සුදුසු යැපෙන්නන්ට මූල්‍යාධාර ලබා දීම.

   ආ. සංගමයේ සාමාජිකයන් වන්නා වූ සහ වරින් වර ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් අනුමත කර ඇති පරිදි ශිෂ්‍යත්ව සඳහා සකස් කරන ලද රීති ප්‍රකාරව ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන සේවා මුක්ත භටයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම.

   ඇ. අවශ්‍යනම් විධායක කමිටුවට, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය විසින් මෙම අරමුදලට අදාළව පමණක් කරන ලද පරිපාලන වියදම් සඳහා ආදායමෙන් 5% ක් නොඉක්මවන්නා වූ මුදලක් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගිණුමට මාරු කර යැවීමට හැකිය.

**2009 ජනවාරි 04 වැනි දින පැවැති විශේෂ මහා සභා රැස්වීමේ දී තුන්වැනි උපලේඛනයට කරන ලද සංශෝධන**

1. තුන්වැනි රීතියට එකතු කිරීම.

   "අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් සඳහා භාවිතා කළ හැකිය."

2. 4 ඇ රීතිය

   " අවශ්‍යනම්, සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පරිපාලනය සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගිණුමට අරමුදල් මාරු කිරීම ආදායමෙන් 10% නොඉක්මවන මුදලක් දක්වා වැඩි කිරීම."

## 4 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණයන්ගේ නිවාස භාර අරමුදල**
**(යම් වෙනසක් සඳහා රීති වශයෙන් පවතින කොන්දේසිවලට යටත්ව)**
**(2001 ජනවාරි 7 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත කරන ලදි.)**

1. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණයන්ගේ නිවාස භාර අරමුදල යන්නෙන් හඳුන්වනු ලබන අරමුදලක් වේ. ප්‍රවීණයන්ගේ නිවාසයට ලැබෙන සියලුම මුදල් අරමුදලේ ආයෝජනය කළ යුතු අතර ප්‍රවීණයන්ගේ නිවාසයට අයත් සියලූම දේපළ (චංචල හෝ ස්ථාවර) මෙම අරමුදල යටතේ ගිණුම්ගත කර ඒ අනුව අගය වැඩිකිරීම/අගය අඩුකිරීම කළ යුතුය.

2. ශ්‍රී ලංකා රජයේ වගකීමක් සහිත යෝජිත වැඩපිළිවෙළකට පමණක් මෙම අරමුදල ආයෝජනය කළ යුතුය.

3. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණයන්ගේ නිවාසයට ඇතුළත් කරගැනීම සඳහා සහ විධායක කමිටුව විසින් අනුමත කර ඇති පරිදි එවැනි නිවාස පරිපාලනය කිරීම සඳහා රීති ප්‍රකාරව නිර්දේශ කර ඇති සහ පිළිගෙන ඇති සංගමයේ සාමාජිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා මෙම අරමුදල ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් භාවිතා කළ යුතුය.

## 5 වැනි උපලේඛනය

## යෝජනා සම්මතය 1 - ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධන පහසුකම් සංවර්ධන අරමුදල

**(2009 ජනවාරි 04 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත කරන ලදි.)**

1. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධන පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුදල යන්නෙන් හඳුන්වනු ලබන අරමුදලකි.

2. මෙම අරමුදලට ලැබෙන සියලූම මුදල් එකතු කිරීම, භාරකාරත්වය, වියදම් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරිකවරයා හරහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් වගකිව යුතුය.

3. ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ලැබෙන අනුග්‍රාහක මුදල් සහ සුබපතන්නන්ගෙන් ලැබෙන විශේෂ පරිත්‍යාග මෙම අරමුදලට බැර කළ යුතුය.

4. මෙම අරමුදලින් සිදුකරන වියදම් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයෙන් විධායක කමිටුව හරහා සහ එහි භාණ්ඩාගාරික හරහා සිදුකළ යුතු අතර පහත සඳහන් අරමුණු උදෙසා පමණක් වියදම් කළ යුතුය.
   - i. නිවාඩු නිකේතන ඉදිකිරීම
   - ii. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීම
   - iii. යටිතල පහසුකම් සැපයීම
   - iv. විනෝදාස්වාද අරමුණු
   - v. අරමුදලේ පරිපාලන පිරිවැය

5. ශ්‍රී ලංකා රජයේ වගකීමක් සහිත යෝජිත වැඩපිළිවෙළකට පමණක් මෙම අරමුදල ආයෝජනය කළ යුතුය.

## යෝජනා සම්මතය 2

2009 ජනවාරි 04වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත කරන ලදි.

රජයේ ඉඩම් ලබාගැනීමේ අරමුණින් සහ කෘෂිකාර්මික, සත්ව පාලන, මිරිදිය ධීවර කර්මාන්තය සහ වටිනාකම් එකතුවන අදාළ කටයුතු සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වීම පිණිස සීමිත වගකීම් සමාගමක් ස්ථාපනය කිරීම.

## 1992 අංක 42 දරන (මෙම පනත පාර්ලිමේන්තුව මගින් පමණක් සංශෝධනය කළ හැකිය) පනත මගින් සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත

1 වැනි උපලේඛනය

2001 ජනවාරි 7 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී අනුමත කර ඇති පරිදි සංගමයේ රීති

(මෙම රීති, පනතේ 5 වැනි වගන්තිය මගින් බලය දී ඇති පරිදි ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ 2/3 ක බහුතර ඡන්දයෙන් පරිච්ජින්න කිරීම, සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කළ හැකිය.)

2 වැනි උපලේඛනය

"සන්නද්ධ සේවා අනුස්මරණ දිනය සහ පොපි දින අරමුදල" 2001 ජනවාරි 07 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමේ දී අනුමත කර ඇති පරිදි හා ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශ කරනු ලැබූ යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදලට අනුප්‍රාප්තික නව නාමය

[ඒ අනුව පනතේ 10 වැනි වගන්තිය සංශෝධනය කළ යුතුව ඇත. මෙය පනත යටතේ සිදුකරන ලද නියෝගයක් නිසා ආරක්ෂක අමාත්‍යවරයා විසින් දෙවැනි උපලේඛනය පරිච්ඡින්න කිරීම, සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කළ හැකිය.]

3 වැනි උපලේඛනය

''ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යහ සාධක භාර අරමුදල''

[යම් වෙනස් කිරීමක් සඳහා පළමුවැනි උපලේඛනයේ පවතින කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීතිවල කොටසක් යොදාගනු ලබයි]

4 වැනි උපලේඛනය

''ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ප්‍රවීණයන්ගේ නිවාස භාර අරමුදල''

[යම් වෙනස් කිරීමක් සඳහා පළමුවැනි උපලේඛනයේ පවතින කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීතිවල කොටසක් යොදාගනු ලබයි]

**සටහන : ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනතේ 9 වැනි වගන්තියේ "ගරු ලේකම්වරයා" යනුවෙන් දක්වා ඇත. 2001 ජනවාරි 07 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී"මහ ලේකම්" වශයෙන් මෙම ධූරය දරන්නාගේ නිල නාමය නැවත නම් කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශ කළ යුතු බව අනුමත කරන ලදී**

# <u>රීතිවලට පසුව සිදුකරන ලද සංශෝධන</u>

<u>5 වැනි උපලේඛනය</u>

වර්ෂ 2017 අප්‍රේල් මස 29 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය විසින් අනුමත කරන ලදි.

**ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති සඳහා සංශෝධන**

**1 වැනි යෝජනා සම්මතය**

23 වැනි රීතිය සඳහා සංශෝධන - මූල්‍ය සහ ගිණුම් - (ආ) උපජේදය

23 (ආ) (1) උපජේදය ''ශ්‍රීලසේමුභස ගිණුම'' යන වචන ඉවත් කර '' ''ශ්‍රීලසේමුභස කළමනාකරණ අරමුදල'' යනුවෙන් ආදේශ කරන්න.
අනුක්‍රමික අංක (6)ට පසුව පහත සඳහන් සංශෝධන එකතු කරන්න.

(7) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජික සුභ සාධන ණය අරමුදල

(8) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පවුල් සුභ සාධන අරමුදල

**<u>සටහන :</u>** ඉහත ගිණුම්/අරමුදල් අනුක්‍රමික අංක 7 හා 8 විධායක කමිටුවේ අනුමැතිය ඇතිව ස්ථාපිත කරනු ලැබූ අතර පසුව 2016 වර්ෂයේ දී මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී සහතික කරන ලදි .

**ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීති පොතේ පස්වැනි උපලේඛනයට පසුව පහත සඳහන් උපලේඛන එකතු කිරීම.**

<u>6 වැනි උපලේඛනය</u>

**<u>ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධන ණය අරමුදල</u>**

1. අඩු පොලී අනුපාත ණය පහසුකම් ලබාදීම මගින් අගහිඟකම් ඇති සාමාජිකයන් වෙත මූල්‍යාධාර ලබාදීම ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධන ණය අරමුදලේ පරමාර්ථය වේ.

2. සභාපති, උපසභාපතිවරුන් තිදෙනා, ගරු මහ ලේකම් හා ගරු භාණ්ඩාගාරිකගෙන් සමන්විත විධායක කමිටුවට වගකිවයුතු කමිටුවක් මගින් මෙම අරමුදල කළමනාකරණය කරනු ලබන්නේය.

3. ආරම්භක කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන දහයක් (මිලියන 10) වන අතර ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය, අනුබද්ධිත සංගම්, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ

සංගමයට අනුබද්ධිත සංස්ථාපිත සංගම් සහ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ එක් එක් සාමාජිකයන්ට අයිති කොටස්වලින් එය සමන්විත වේ.

4. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ වාර්ෂික සම්මේලනයේ දී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුමත කරනු ලැබීමෙන් පසුව උපදවනු ලබන ලාභවලින් 25% ක උපරිමයක් දක්වා වූ මුදලක් ලාභාංශ වශයෙන් සෑම වර්ෂයකම මැයි මාසයේ දී කොටස් හිමියන්ට ගෙවනු ලබන්නේය.

5. කොටස් නිකුත් කිරීම, අරමුදල කළමනාකරණය සහ ලාභ ගෙවීම පිළිබඳ විස්තරාත්මක පරිපාලන සහ මෙහෙයුම් උපදෙස් හා මාර්ගෝපදේශ විධායක කමිටුවේ අනුමැතිය ඇතිව කළමනාකරණ කමිටුව විසින් නිකුත් කරනු ඇත.

## 7 වැනි උපලේඛනය

## ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පවුල් සුභ සාධක අරමුදල

1. ඉතා බරපතළ සෞඛ්‍ය තත්ත්වයන් හෝ නිදන්ගත රෝග සඳහා ප්‍රතිකාර ලැබීමට දැඩි මූල්‍ය අවශ්‍යතාවෙන් සිටින්නා වූ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සාමාජිකයන්ගේ පවුල්වලට (භාර්යාවන්/ස්වාමිපුරුෂයන් සහ වයස අවුරුදු 18ට අඩු ළමයින් ආවරණය කරමින්) මූල්‍ය ආධාර ලබාදීම මෙම අරමුදලේ ප්‍රධාන පරමාර්ථය වේ. වයස අවුරුදු 18ට වැඩි වුවත් බරපතළ රෝග හේතු කොටගෙන ආබාධිත වූ ළමයින් හට ආධාර දීම සඳහා සලකා බැලිය හැකිය.
2. ශ්‍රී ලංකා යුධ හමුදාවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාවෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ලැබෙන දායක මුදල් සහ පරිත්‍යාගශීලීන්ගෙන් හා සංවිධානවලින් ලැබෙන විශේෂ පරිත්‍යාග/ආධාර මෙම අරමුදලට බැරකරනු ලබන්නේය.

3. ශ්‍රී ලංකා රජයේ වගකීමක් ඇති යෝජනා ක්‍රමවල පමණක් මෙම අරමුදල ආයෝජනය කළ යුතුය.
4. ආයෝජනවලින් ලැබෙන ආදායම පමණක් උපයෝගී කර ගත හැකි ආකාරයේ ආධාර ලබාදීම් සඳහා මෙම අරමුදල භාවිතා කළ යුතුය.

5. අවශ්‍ය අවස්ථාවල දී, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පරිපාලන වියදම් සඳහා එම සංගමයේ විධායක කමිටුවේ අනුමැතිය ඇතිව ආදායමෙන් සියයට පහක් 5% (සියයට පහක උපරිමයක් දක්වා) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ ගිණුමට මාරුකර යැවිය හැකිය.

## 8 වැනි උපලේඛනය

## ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ කළමනාකරණ අරමුදල

1. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සියලු කටයුතු කළමනාකරණය කිරීම සහ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට අයත් වන අනෙකුත් සියලුම ගිණුම් හා අරමුදල් කළමනාකරණය කිරීමේ වගකීම දරන කාර්ය මණ්ඩලයේ පඩිනඩි ඇතුළු ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ මහ ලේකම් කාර්යාලයේ සහ එහි කාර්යයන් මනාව පවත්වාගෙන යාම, නඩත්තු කිරීම, කළමනාකරණය සහ පරිපාලනයට අදාළ සියලු වියදම් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ කළමනාකරණ අරමුදල විසින් දරනු ලබන්නේය.

2. විධායක කමිටුව වෙනුවෙන් මෙම ගිණුම් පාලනය කිරීමේ වගකීම සභාපති, ගරු මහ ලේකම් සහ ගරු භාණ්ඩාගාරික සතු වන්නේය.

3. සුභ පතන්නන් විසින් සිදු කරන විශේෂ පරිත්‍යාග, ස්වකීය ආයෝජන, ප්‍රවීණ ලොතරැයිය ඇතුළු අරමුදල් තර කිරීමේ ක්‍රියාකාරකම්, හැඳුනුම්පත් ගාස්තු සහ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පහත සඳහන් ගිණුම් හා අරමුදල්වලින් ලැබෙන කළමණාකරණ ගාස්තු ගිණුමේ ආදායමට අයත්වේ.

   (අ) යහ සාධක භාර අරමුදල - තුන්වැනි උපලේඛනයේ සඳහන් 4 ඇ රීතිය අනුව පොලියෙන් 10%ක්,

   (ආ) පවුල් සුභ සාධන අරමුදල - 7 වැනි උපලේඛනයේ සඳහන් 5 වැනි රීතිය අනුව පොලියෙන් 5% ක්,

   (ඇ) රාජකීය පොදු රාජ්‍ය මණ්ඩල සේවා මුක්ත ලීගයෙන් (RCEL) ලැබෙන දායක මුදල්වලට අනුව

   (ඈ) සන්නද්ධ හමුදා අනුස්මරණ දින අරමුදල (AFRD) (විධායක කමිටුව තීරණය කරනු ලබන පරිදි)

   (ඉ) ප්‍රවීණයන්ගේ නිවාස අරමුදල (විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි),

   (ඊ) අරමුදල් තරකිරීමේ කටයුතු, පරිත්‍යාග, ආයෝජන මගින් උපදවන මුදල් හා හැඳුනුම් පත් නිකුත් කිරීම, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සුභ සාධන ණය අරමුදලෙන් ලැබෙන ලාභාංශ. (විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි)

4. කළමනාකරණ ගාස්තු ගෙවීමට සමහර ගිණුම්වලට සහ අරමුදල්වලට නොහැකි වීම හෝ ස්වකීය ආයෝජන හෝ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම අඩුවීම නිසා වාර්ෂික අයවැය කළමනාකරණය කිරීම සඳහා ආදායම ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, විධායක කමිටුව විසින් හැකි පරිදි වියදම් අඩු කිරීමට තීරණ ගැනීමට සහ සංගමයේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකිය. සංගමයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාම තහවුරු කිරීම සඳහා

භාරකාර මණ්ඩලයේ එකඟතාව ඇතිව සහ විධායක කමිටුවේ අනුමැතිය ඇතිව තාවකාලික ක්‍රියා මාර්ගයක් වශයෙන් වෙනත් ගිණුමකින් අරමුදල් මාරු කිරීම සලකා බලනු ලැබිය හැකිය.

**2 වැනි යෝජනා සම්මතය**

**23 වැනි රීතියට සංශෝධන - මූල්‍ය සහ ගිණුම් - (ඈ) උපඡේදය**

පවත්නා (ඈ) උපඡේදය ඉවත් කර පහත දක්වා ඇති නව (ඈ) උපඡේදය එකතු කරන්න.

"සියලුම වියදම්, රීතිවලට අනුකූලව සිදුකළ යුතු අතර අයවැය තුළ බලය ලබා දී ඇති සීමාව නොඉක්මවිය යුතුය. අයවැයෙන් වෙන්කර නොමැති, සිදුකිරීමට අපේක්ෂිත යම් වියදමක් සඳහා, ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුවේ පූර්ව අනුමැතිය ඇතිව භාරකාර මණ්ඩලයේ අභිමතය පළකර තිබිය යුතුය."

**3 වැනි යෝජනා සම්මතය**

**23 වැනි රීතියට සංශෝධන - මූල්‍ය සහ ගිණුම් - (ඉ) උපඡේදය**

පවත්නා (ඉ) උපඡේදය ඉවත් කර පහත දක්වා ඇති නව (ඉ) උපඡේදය එකතු කරන්න.

"සියලුම ගෙවීම් විධායක කමිටුව විසින් අනුමත කළ යුතුය. කෙසේ වුව ද අයවැයට ඇතුළත් කරන ලද දෛනික ස්වභාවයේ පරිපාලන වියදම් හෝ වෙනත් යම් වියදමක්, ගරු මහ ලේකම්වරයාගේ නිර්දේශය මත සභාපතිවරයාගේ අනුමැතිය සහිතව දැරිය හැකි අතර එවැනි වියදමක් සිදුවූ වහාම පවත්වන්නට නියමිත විධායක කමිටුවේ ආවරණ අනුමැතිය සඳහා එවැනි වියදම් ඉදිරිපත් කළ යුතුය.''

**4 වැනි යෝජනා සම්මතය**

**23 වන රීතියට සංශෝධන - මූල්‍ය සහ ගිණුම් (උ) උපඡේදය**

පවත්නා (උ) උපඡේදය ඉවත් කර පහත සඳහන් නව (උ) උපඡේදය එකතු කරන්න.

''අයවැයගත නොවූ වැදගත් කාර්යයන් සපුරාලීම පිණිස හදිසි ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගුණහොත් ගරු මහ ලේකම්ගේ හා ගරු භාණ්ඩාගාරිකගේ නිර්දේශ අනුව සභාපතිගේ අනුමැතිය මත කාර්තුවකට රු. 100000.00 නො ඉක්මවා මුදලක් ගෙවීම කළ හැකිය. කෙසේ වෙතත් එවැනි වියදමක් සිදු කළ වහාම විධායක කමිටු රැස්වීමකදී විධායක කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගත යුතුය.''

## 5 වැනි යෝජනා සම්මතය

**23 වැනි රීතියට සංශෝධන - මූල්‍ය හා ගිණුම් - (ඩ) නව උපඡේදය.**

පහත සඳහන් පරිදි නව (ඩ) උපඡේදය එකතු කරන්න.

"ජංගම හෝ ස්ථාවර වත්කම් මිලදී ගැනීම හෝ රුපියල් ලක්ෂ දහයකට වැඩි බදු කුලී වියදම් සම්බන්ධ ව්‍යාපෘතියකට කරන යම් ආයෝජනයක්, අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපති විසින් නම් කරනු ලබන කමිටුවක් විසින් අධ්‍යයනය කළ යුතුය. මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ සභාපතිවරයාට ශක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. සභාපතිවරයා විසින් ප්‍රධාන නිලධරයන් සමඟ එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පසුව ඔහුගේ නිර්දේශ සහ භාරකාර මණ්ඩලයේ නිර්දේශ සහිතව එම වාර්තාව විධායක කමිටුවට ඉදිරිපත් කළ යුතුය. එවැනි ආයෝජන සඳහා භාරකාර මණ්ඩලයේ එකඟතාවය සහ විධායක කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන්නේය."

## 6 වැනි යෝජනා සම්මතය

**23 වැනි රීතියට සංශෝධන - මූල්‍ය සහ ගිණුම් - නව (ඪ) උපඡේදය**

පහත සඳහන් පරිදි නව (ඪ) උපඡේදය එකතු කරන්න.

1. 23 වැනි රීතියේ (ඊ) උපඡේදයෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ අරමුදල්/ගිණුම්වලට ලැබෙන සියලුම මුදල් ප්‍රධාන නිලධරයන්ගේ අත්සන යටතේ ස්ථාවර තැන්පතු වශයෙන් රජයේ බැංකුවල (පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය වන මුදල් හැර) තැන්පත් කළ යුතුය. එම ස්ථාවර තැන්පතු ආපසු ගැනීම සඳහා (ඊ) උපඡේදයෙහි දක්වා ඇති පරිදි ඕනෑම අත්සන්කරුවන් දෙදෙනෙකුගේ අත්සන් සහ ගරු භාණ්ඩාගාරිකවරයාගේ අත්සන අනිවාර්යයෙන් තිබිය යුත්තේය. (මුළු අත්සන් ප්‍රමාණය තුනකි.)

2. සංවිධානවලින් සහ එක් එක් පුද්ගලයන්ගෙන් ලැබෙන සියලුම දායක මුදල් හා පරිත්‍යාග විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි අදාළ අරමුදල්/ගිණුම්වල තැන්පත් කළ යුතු අතර ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ අරමුදල්/ගිණුම්වලට දැමූ පසු කිසිම අවස්ථාවක දී එම පරිත්‍යාග/දායක මුදල්වලින් කොටසක් හෝ සම්පූර්ණයෙන් ආපසු ගෙවීම / නැවත හිමිකම් පෑම නොපිළිගත යුතුය.

**<u>7 වැනි යෝජනා සම්මතය</u>**

**23 වැනි රීතියට සංශෝධන - මූල්‍ය සහ ගිණුම් - නව (ඔ) උපජේදය**

පහත සඳහන් පරිදි නව උපජේදය එකතු කරන්න.

"සොරකම, අනවසර ප්‍රවේශය හෝ ගින්නක් මගින් බලපාන්නාවූ යම් උපද්‍රව වළක්වා ගැනීම සඳහා නෛතික ලේඛන, ස්ථාවර තැන්පත් සහතික පත්‍ර සහ භාණ්ඩාගාර බැඳුම්කර සහතික පත්‍ර සහ අනෙකුත් රහස්‍ය ලේඛනවල මුල් පිටපත් ඇතුළුව සියලුම මූල්‍ය ගිණුම්, වාර්තා හා ලේඛන ප්‍රවේසම් සහගතව හා සුරක්ෂිතව තැන්පත් කරනු ලැබ ඇති බවට ප්‍රධාන ගණකාධිකාරිවරයා හා ගිණුම් කාර්ය මණ්ඩලය හරහා ගරු භාණ්ඩාගාරිකවරයා සහතික විය යුතුය. සභාපතිවරයා සහ ගරු මහ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව ගරු භාණ්ඩාගාරික විසින්, ගිණුම්/අරමුදල් විධිමත් පරිදි කළමනාකරණය සහ සියලූම මුදල් වාර්තා සහ මූල්‍ය ගනුදෙනුවලට අදාළ අනෙකුත් ලේඛනවල භෞතික ආරක්ෂාවට සම්බන්ධ වී සිටින හා වග කිවයුතු ගණකාධිකාරිවරයාට හා කාර්ය මණ්ඩලයට, අවශ්‍ය පරිදි නියෝග උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය."

**ශ්‍රී ලංකා සේවා මුක්ත හටයන්ගේ සංගමයේ සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා සේවා මුක්ත හටයන්ගේ සංගමයේ රීතිවලට යෝජිත සංශෝධන**

**<u>8 වැනි යෝජනා සම්මතය</u>**

**4 වැනි රීතියට සංශෝධන - සභාපති (එමැරිටස්)**

2014 අප්‍රේල් මස 27 වැනි දින පැවැති මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී සම්මත කරගන්නා ලද අභියෝජනාවක් මගින් 4 වැනි රීතියෙහි සභාපති (ඔනරිස් කව්සා) යන පාඨය සභාපති (එමැරිටස්) යනුවෙන් සංශෝධනය කිරීම.

සභාපති (ඔනරිස් කව්සා) යන උපශීර්ෂය යටතේ පවත්නා ජේදය පහත සඳහන් පරිදි සංශෝධනය කළ යුතුය.

**4 වැනි රීතිය - (1) සභාපති (එමැරිටස්)**

මහා මණ්ඩලය විසින් වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමකදී පැමිණ සිටින සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් විධායක කමිටුවේ නිර්දේශය මත , ශ්‍රී ලංකා සේවා මුක්ත හටයන්ගේ සංගමයේ ගුණාත්මක අභිවෘද්ධිය ඇති කිරීමට ඉතා විශිෂ්ට, සුවිශේෂී හා සාධනීය සේවාවක් ඉටුකර ඇති සංගමයේ හිටපු සභාපතිවරයෙකු සභාපති (එමැරිටස්) වශයෙන් තෝරා පත් කරනු ලැබිය හැකිය.

(අ) එසේ පත්කරනු ලබන ගරු සභාපතිවරයා ජීවිතාන්තය දක්වා හෝ තනතුර දරන්නාගේ අභිමතය ඇතිතාක් කල් නිලය දරනු ලබන්නේය.

(ආ) සභාපති (එමැරිටස්) ඔහුගේ අභිමතය පරිදි මහා මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගි වනු ඇත.

(ඇ) එසේ පත් කරනු ලබන සභාපති (එමැරිටස්) වෙත විධායක කමිටුව විසින් අනුමත කර ඇති සැලැස්මකට අනුව නිම කළ සුදුසු නිල ලාංඡනයක් පිරිනැමිය යුතුය.

<u>9 වැනි යෝජනා සම්මතය</u>

**4 වැනි රීතියට සංශෝධන - සභාපති (ඔනරිස් කව්සා)**

උපසභාපති (ඔනරිස් කව්සා) යනුවෙන් පවත්නා පදවි නාමය සභාපති (ඔනරිස් කව්සා) යනුවෙන් සංශෝධනය කිරීම හා පහත සඳහන් පරිදි අර්ථ නිරූපණය කිරීම සඳහා සංශෝධන කළ යුතු උපශීර්ෂ යටතේ පවත්නා ඡේදය ඉවත් කිරීම.

**4 වැනි රීතිය (2) සභාපති (ඔනරිස් කව්සා)**

අ. මහා මණ්ඩලය විසින් යම් වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විධායක කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇති සංගමයේ සභාපති, උපසභාපති, මහ ලේකම් හෝ භාණ්ඩාගාරික තනතුර ඇතුළුව වසර 10ක් වගකීම් සහිත තනතුරු දරමින් ප්‍රශංසනීය සේවාවක් කර ඇති යාවජීව සාමාජිකයෙකු සභාපති (ඔනරිස් කව්සා) යන පදවි නාමය පිරිනැමීම සඳහා තෝරා පත්කරගත හැකි වන්නේය.

ආ. සභාපති (ඔනරිස් කව්සා) යන පදවි නාමය ලැබූ සාමාජිකයා විසින් ජීවිත කාලයම හෝ තනතුර දරන්නාගේ අභිමතය පරිදි ධූරය දැරිය යුතුය.

ඇ. ඔහුට/ඇයට මහා මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගිවීමේ අයිතිය තිබිය යුතුය.

ඈ. සභාපති (ඔනරිස් කව්සා) පදවි නාමය සඳහා තෝරා පත්කර ගත් සාමාජිකයා වෙත විධායක කමිටුව විසින් අනුමත කර ඇති සැලැස්මකින් යුත් සුදුසු නිල ලාංඡනයක් පිරිනැමිය යුතුය.

<u>10 වැනි යෝජනා සම්මතය</u>

**උපසභාපති (ඔනරිස් කව්සා)**

සැලකිය යුතුයි: මෙම 4 වැනි රීතියේ උපසභාපති (ඔනරිස් කව්සා) රීති පොතෙන් ඉවත් කළ යුතුය.

<u>රීතිවලට පසුව සිදුකරන ලද සංශෝධන</u>

2014 ඔක්තෝබර් 12 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදි .

**සංශෝධන (අතිරේකය) අංක 01 - 14 වැනි රීතිය**

2012 අප්‍රේල් 29 වන දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී "සංශෝධන (අතිරේකය) - අංක 01 - 14 වැනි රීතිය (ඊ)" වශයෙන් ඒකමතිකව සම්මත කරගන්නා ලද සංශෝධනය ඉවත් කළ/අවලංගු කළ යුත්තේය.

## රීතිවලට පසුව සිදුකරන ලද සංශෝධන

2014 ඔක්තෝබර් 12 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත කරගන්නා ලදි.

**සංශෝධනය (අතිරේකය) - අංක 2 රීතියෙහි අංක 5 (ඈ) - යාවජීව සාමාජිකත්වය**

1. ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ අභිවෘද්ධිය උදෙසා සුවිශේෂී දායකත්වයක් සිදුකර ඇති එකී සංගමයේ ඕනෑම සාමාජිකයෙකු විධායක කමිටුවේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින් යාවජීව සාමාජිකත්වය සඳහා තෝරා පත් කර ගැනීම සඳහා සුදුසු වන්නේය. එසේ වුව ද එම සාමාජිකයා සමුච්චිත වසර 10ක කාල පරිච්ඡේදයක් මහා මණ්ඩලයේ සේවය කර ඇති සහ විධායක කමිටුවේ හෝ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යම් අනුකමිටුවක සාමාජිකයෙකු වශයෙන් සමුච්චිත වශයෙන් වසර පහකට නොඅඩු කාලයක් සේවය කර තිබිය යුතුය.

2. මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම උදෙසා, සාමාජිකයෙකු විසින් එකී නිශ්චිත වර්ෂවලදී වාර්ෂික සම්මේලනයට සහභාගී වී සිටිය යුතුය. එසේ වුව ද යම් නිශ්චිත වර්ෂයක වාර්ෂික සම්මේලනය සහභාගී නොවීමට විධායක කමිටුව විසින් සාමාජිකයෙකුට අවසර දී ඇති නම් මෙම රීතියට අනුව මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම සඳහා එම වර්ෂය සැලකිල්ලට ගත යුතුය.

2012 අප්‍රේල් 29 වන දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනය මගින් ඒකමතිකව අනුමත කරන ලදි.

**14 වැනි රීතියට සංශෝධන**

2012 අප්‍රේල් 29 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේදී "සංශෝධනය (අතිරේකය) - අංක 14 වැනි රීතිය (ඊ)" වශයෙන් ඒකමතිකව සම්මත කරගන්නා ලද සංශෝධනය ඉවත් කළ/අවලංගු කළ යුත්තේය.

14 (ඊ) රීතිය

සංගමයේ ප්‍රධාන නිලධරයන් වසර 3ක කාලයක් ධූර දැරිය යුත්තේය. කෙසේ වෙතත් සුවිශේෂි අවස්ථාවන්වලදී, ඔහුගේ/ඇයගේ සේවාවන් මෙම කාල පරිච්ඡේදය තුළ අවශ්‍යම යැයි හැඟී යන්නේ නම් විධායක කමිටුව විසින් ඔවුන්ගෙන් යම් කෙනෙකුට සේවා දිගුවක් ප්‍රදානය කළ හැකිය.

2012 අප්‍රේල් 29 වන දින පවත්වන ලද මහා මණ්ඩලීය වාර්ෂික සම්මේලනය මගින් ඒකමතිකව අනුමත කරන ලදී.

5 (ඈ) රීතිය සංශෝධනය - යාවජීව සාමාජිකත්වය

1. ශ්‍රී ලංකා සේවා මුක්ත  භටයන්ගේ සංගමයේ අභිවෘද්ධිය උදෙසා සුවිශේෂි දායකත්වයක් සිදුකර ඇති එකී සංගමයේ ඕනෑම සාමාජිකයෙකු විධායක කමිටුවේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින් යාවජීව සාමාජිකත්වය සඳහා තෝරා පත්කර ගැනීම සඳහා සුදුසු වන්නේය. එසේ වුව ද එම සාමාජිකයා සමුච්චිත වසර 10ක කාල පරිච්ඡේදයක් මහා මණ්ඩලයේ සේවය කර ඇති සහ විධායක කමිටුවේ හෝ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යම් අනුකමිටුවක සාමාජිකයෙකු වශයෙන් සමුච්චිත වශයෙන් වසර පහකට නොඅඩු කාලයක් සේවය කර තිබිය යුතුය.

2. මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම උදෙසා, සාමාජිකයෙකු විසින් එකී නිශ්චිත වර්ෂවලදී වාර්ෂික සම්මේලනයට සහභාගී වී සිටිය යුතුය. එසේ වුව ද යම් නිශ්චිත වර්ෂයක වාර්ෂික  සම්මේලනයට සහභාගි නොවීමට විධායක කමිටුව විසින් සාමාජිකයෙකුට අවසර දී ඇති නම් මෙම රීතියට අනුව මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම සඳහා එම වර්ෂය සැලකිල්ලට ගත යුතුය.

<u>අභියෝජනා 1 හා 2 සඳහා විවරණ සටහන්</u>

<u>යෝජනා සම්මතය 1</u>

මෙම සංශෝධන අර්ථ නිරූපණය කිරීමේ දී හා අදාළ කර ගැනීමේ දී ඇති වූ අර්ථ ව්‍යාකූලත්වය නිසා 14ඊ රීතියෙහි පවත්නා සංශෝධනය 2014 වර්ෂයේ අවසාන වරට පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ සහ විධායක කමිටුවේ රැස්වීම් කිහිපයක දී විස්තරාත්මකව සාකච්ඡා කරන ලදි .

එනම්;

අ. "වසර තුනක් ධූරය දැරිය යුත්තේ ය." - සමුච්චිතව හෝ අනුගාමීව දැයි නිශ්චිතව සඳහන් කර නොමැත. විශේෂිත ධූරය හෝ නිලධරයන් තුන් දෙනෙක්ගේ ධූරය ද යන්න පිළිබඳ පැහැදිලි නැත.

2014 සැප්තැම්බර් 25 වැනි පවත්වන ලද විධායක කමිටුවේ ඒකමතික තීරණය මෙම සංශෝධනය අහෝසි කිරීම සඳහා හේතු විය. මෙම සංශෝධනයට පෙර ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය කිසිම ගැටලුවක් නොමැතිව දශක කිහිපයක් ක්‍රියාත්මකව පැවැති අතර පැවැති රීතිය සංශෝධනය කිරීමට හේතුවක් නොමැත. එසේම, නිලධරයන් වාර්ෂිකව තෝරා පත් කරගන්නා අතර, කිසිම හේතුවක් නිසා එකම තනතුරට නැවත තෝරා පත්කර ගැනීමේ දී මහා මණ්ඩල සාමාජිකත්වය යම් නිලධරයෙකුට වාසියක් නොවන අතර, ඔහුව ඡන්දය ප්‍රකාශ කර නැවත තෝරා පත්කර නොගනු ඇත.

**<u>යෝජනා සම්මතය 2</u>**

**<u>රීති අංක 5 (ඈ) හි සංශෝධනය</u>**

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ පෙර පැවති රීති 2001 ජනවාරි 07 වැනි දින සම්මත කර ගන්නා ලද අතර 2012 ජනවාරි 29 දිනට පෙර බලාත්මක විය. යාවජීව සාමාජිකත්ව නිර්ණායකයන් එහි රීති අංක 11 (අ) $(ii)$ යටතේ නියම කර සඳහන් කර ඇත. අනුගාමී වර්ෂ 10කට වැඩි කාලයක් මහා මණ්ඩලයේ සේවය කර ඇති සියලුම සාමාජිකයන් ගරු යාවජීව සාමාජිකත්වය සඳහා තෝරා පත් කර ගැනීමට සුදුසු වන්නේය.

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයට ලබාදෙන සුවිශේෂී දායකත්වය මෙම නිර්ණායකය මගින් මැනිය නොහැකි අතර මහා මණ්ඩලයේ අනුගාමී වසර 10ක සාමාජිකත්වය ද සාක්ෂාත් කර ගැනීමට අපහසු බව ඒ අවස්ථාවේ දී හැඟී ගියේය.

ඒ අනුව විධායක කමිටුවේ වසර 7ක සේවා කාලයක් තිබීම අන්තර්ගත කිරීමට 2012 ජනවාරි 29 වැනි දින සංශෝධනය කර සම්මත කරගන්නා ලද අතර මහා මණ්ඩලයේ සාමාජිකත්වය සමුච්චිත වසර 10ක් ලෙස ගණනය කිරීම ලිහිල් කරන ලදි .

දැනට සාමාන්‍ය සාමාජිකයෙකුට විධායක කමිටුව තුළ වසර 7ක සාමාජිකත්වයක් සම්පූර්ණ කළ නොහැකි බව සාමාජිකයින් කිහිපදෙනෙක් විසින් කරුණු ඉදිරිපත් කර ඇත. කෙසේ වුව ද, යාවජීව සාමාජිකත්වය සඳහා සලකා බලන විට විධායක කමිටුවේ නොමැති එහෙත්, විධායක කමිටුවේ සාමාජිකයෙකුගේ සේවයක් ලෙස සමානව හඳුනාගත යුතු වන අනුකමිටු හරහා ස්වකීය සේවා දායකත්වය අඛණ්ඩව ලබා දෙන සාමාජිකයන් සිටිති.

මෙම තර්කයට ප්‍රතිචාර වශයෙන් නව සංශෝධනය හඳුන්වා දෙන ලදි .

## මහා මණ්ඩලයේ අවධානය සඳහා සුදුසු සහ අදාළ යැයි සලකන්නේ නම් සම්මත කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ රීතිවලට කරන ලද සංශෝධනවලට යෝජනා සම්මත 1 හා 2

### යෝජනා සම්මත 1

### 14 වැනි රීතියෙහි සංශෝධනය

2012 අප්‍රේල් 29 වැනි දින පවත්වන ලද මහා මණ්ඩලයේ වාර්ෂික සම්මේලනයේ දී "**සංශෝධනය (අතිරේකය) 14 වැනි රීතියෙහි (ඊ)**" වශයෙන් ඒකමතිකව සම්මත කරගන්නා ලද සංශෝධනය ඉවත් කළ/අවලංගු කළ යුත්තේය.

### යෝජනා සම්මතය 2

### රීති අංක 5 (ඈ) හි සංශෝධනය - යාවජීව සාමාජිකත්වය

පවත්නා රීති අංක 5 (ඈ) - පවත්නා ඡේදය ඉවත්කර පහත සඳහන් පරිදි නව ඡේදය ඇතුළත් කරන්න.
ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ අභිවෘද්ධිය උදෙසා සුවිශේෂී දායකත්වයක් සිදුකර ඇති එකී සංගමයේ ඕනෑම සාමාජිකයෙකු විධායක කමිටුවේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින් යාවජීව සාමාජිකත්වය සඳහා තෝරා පත්කර ගැනීම සඳහා සුදුසු වන්නේය. එසේ වුව ද එම සාමාජිකයා සමුච්චිත වසර 10ක කාල පරිච්ඡේදයක් මහා මණ්ඩලයේ සේවය කර ඇති සහ විධායක කමිටුවේ හෝ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයේ යම් අනුකමිටුවක සාමාජිකයෙකු වශයෙන් සමුච්චිත වශයෙන් වසර පහකට නොඅඩු කාලයක් සේවය කර තිබිය යුතුය.

1. මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම උදෙසා, සාමාජිකයෙකු විසින් එකී නිශ්චිත වර්ෂවලදී වාර්ෂික සම්මේලනයට සහභාගි වී සිටිය යුතුය. එසේ වුව ද යම් නිශ්චිත වර්ෂයක වාර්ෂික සම්මේලනයට සහභාගි නොවීමට විධායක කමිටුව විසින් සාමාජිකයෙකුට අවසර දී ඇති නම් මෙම රීතියට අනුව මහා මණ්ඩලය තුළ සාමාජිකත්වයේ සමුච්චිත කාල පරිච්ඡේදය ගණනය කිරීම සඳහා එම වර්ෂය සැලකිල්ලට ගත යුතුය.

රියර් අද්මිරාල් එස් ආර් සමරතුංග ආර් එස් පී වී එස් වී යූ එස් පී
ගරු මහ ලේකම්
ශ්‍රී ලංකා සේවා මුක්ත  භටයන්ගේ සංගමය
ඇමුණුම : යෝජනා සම්මතවලට විවරණ සටහන්

# ජාතික රාජ්‍ය සභාවේ
# 1976 අංක 8 දරන
# ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ
# සංගමය පනත

**(සහතිකය සටහන් කළේ 1976 අප්‍රේල් මස 09 වන දින)**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

**(1976 මැයි මස 7 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)**

# ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනත

**(සහතිකය සටහන් කළේ 1976 අප්‍රේල් මස 09 දින)**

එල්.ඩී. - ඕ.59/75.

ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. පූර්විකාව

''ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වන රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියළු කරුණු පළදායී ලෙස කරගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමට පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කීපය එකී සංගමය විසින් සාර්ථක ලෙස කරගෙන ගොස් ඇති හා ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථානගත කළ යුතු යැයි දැන් අදහස් කරනු ලබන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 08 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු ''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ තත්කාලයෙහි සිටින සාමාජිකයින්, අඛණ්ඩ පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද''ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය'' යන නාමය ද ඇතිව (මෙහි මින්මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතුය. සංස්ථාව විසින් ඒ නමින් නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව ඒ නමින් නඩු පවරනු ලැබීම ද කළ හැකිය. ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ :- සංස්ථාවේ පරමාර්ථ

(අ) 1914 - 1918 හා 1939 - 1945 යුද්ධ සමයන්හි හෝ ඒ අතර කාළ පරිච්ඡේදය තුළ, ලංකා රක්ෂක හමුදාවේ හෝ ලංකා රාජකීය හමුදාවේ හෝ ලංකා නාවික ස්වේච්ඡා හමුදාවේ හෝ ඉක්බිති ලංකා නාවික ස්වේච්ඡා උපසේවා හමුදාවේ යම් ඒකකයක සේවය කළ හා ශ්‍රී ලංකා යුධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් ඒකකයක හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය හමුදා ඒකකයක සේවය කළ සියළුම තරාතිරමේ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන් අතර සහෝදරත්වය හා ලැදියාව වර්ධනය කිරීම :-

(ආ) එකී සේවාමුක්ත භටයන්ගේ සුභසිද්ධිය වැඩිදියුණු කිරීම :-

(ඇ) සේවාමුක්ත භටයන් නැවත පදිංචි කරවීම සම්බන්ධයෙන් අවශ්‍ය නියෝජන රජයන් හා අන් සේවා යෝජකයන් වෙත ඉදිරිපත් කිරීම හා එක් එක් සේවාමුක්ත භටයන් රැකියාවල යෙදවීමෙහි ලා සහය වීම :

(ඈ) විධායක කමිටුවේ මතය අනුව, මුදල් ආධාර අවශ්‍ය සේවා මුක්ත භටයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට මුදල් ආධාර දීම;

(ඉ) ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විශ්‍රාම ගෙන ඇති තැනැත්තන් විසින් සංගමය හා ඒකාබද්ධ වීම සඳහා බලකායීය හා රෙජිමේන්තුමය සංගම් පිහිටුවා ගැනීමට පිහිටාධාර වීම හා දිරි ගැන්වීම; හා

(ඊ) ඒ කාර්යය සඳහා සාදනු ලබන යම් යම් නියෝග වලට අනුකූලව යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල නඩත්තු කිරීම, පවත්වා ගෙන යාම හා කළමනාකරණය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය

4\. (1) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති අනුව, අවස්ථාවෝචිත පරිදි තෝරා පත්කරනු ලබන හෝ නම් කිරීම් පත් කරනු ලබන සංගමයේ නිලධරයන්, විධායක කමිටුව හා මහාමණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු මෙහි මින්මතු විධි විධාන සලස්වනු ලබන පරිදි තත්කාලයෙහි බලපවත්නා රීති වලට යටත්ව පරිපාලනය කරනු ලැබීය යුතුය.

(2) සංස්ථාවේ සියළුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති වලට යටත්විය යුතුය.

රීති සෑදීමේ බලය

5\. (1) සංස්ථාව විසින්, සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන්, සංස්ථාවේ සාමාජිකත්වයට ඇතුලත් කර ගැනීම හා ඉන් ඉවත් කිරීම සදහා ද සංස්ථාවේ නිලධරයන් හා මහා මණ්ඩලය සහ විධායක කමිටුවේ සාමාජිකයින් විසින් ස්වකීය කාර්යයන් කිරීම සඳහා ද සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ ක්‍රියා පටිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් කළ යුතු කළමනාකරණයෙන් හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද රීති සෑදිය හැකිය.

(2) සංස්ථාවේ යම් රීතියක් වෙනස් කිරීම, සංශෝධනය කිරීම, හෝ පරිච්චින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට වැඩි ඡන්දයෙන් කළ හැකිය.

(3) මෙම වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති වල විධිවිධාන වලට යටත්ව, මේ පනතේ පළමුවන උපලේඛණයෙහි සඳහන් රීති සංස්ථාවේ රීති විය යුතුය.

බැරකම් හා ලැබිය යුතු ණය ආදිය.

6\. මේ පනත ක්‍රියාත්මක කරන අවස්ථාවේ පවත්නා සංගමයේ සියළුම ණය හා බැරකම් මෙයින් ස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට ලැබිය යුතු සියළුම ණය හා සංගමයට ගෙවනු ලැබිය යුතු ගාස්තු, සම්මාදම්, දායක මුදල් හා ආධාර මුදල්, සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

07. සංස්ථාව විසින් :-

(අ) මිලට ගැනීමේ, ප්‍රදානය කරනු ලැබීමේ, තෑගි ලැබීමේ, අන්තිම කැමති පත්‍රයකින් බැහැර කරනු ලැබීමේ අයිතිය අනුව හෝ අන් ආකාරයකින්, චංචල හෝ නිශ්චල දේපළ අත් කර ගැනීම හා දැරීම කළ හැකිය :- සංස්ථාව විසින් දේපළ අත්කර ගැනීම, දැරීම හා බැහැර කිරීම ද, මුදල් ණයට ගැනීම ද කළ හැකි බව.

(ආ) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති වලට යටත්ව යම් දේපළක් දැරිය යුතුය :-

(ඇ) එහි දේපළ වලින් යමක්, එම දේපළට අදාළ යම් භාරයකට සහ එම භාර පාලනය කරන නීතියට ද යටත්ව, විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හා අන් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය :- තවද,

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා මුදල් ණයට ගත හැකිය.

8. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ අභිමතය පරිදි වෙනස් කරනු ලැබිය හැකිය. පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් තම නම අත්සන් කළ යුතු සංස්ථාවේ නිලධරයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කවර හෝ සාධන පත්‍රයකට ඒ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තෙකුගේ අත්සන් කිරීමට ස්වාධීන විය යුතුය. සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ ගරු ලේකම් සංස්ථාවේ මුද්‍රාව භාරව සිටිය යුතුය. මුද්‍රාව භාරව සිටීම

10. මෙම පනතේ දෙවන උපලේඛණයෙහි සඳහන් යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදලේ නියෝග වලට අනුකූලව සංස්ථාව විසින් යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල පවත්වාගෙන යාම හා පරිපාලනය කිරීම කළ යුතුය. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල.

11. මේ පනතෙහි සඳහන් අයිතිවාසිකම් හා ඒවා අනුව, ඒවායින් හා ඒවා යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ හැර ජනරජයේ හෝ යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තෙකුගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි අඩංගු කිසිවක් හානි කර නොවිය යුතුයː- නැතහොත් බල නොපෑ යුතුය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනත**

## පළමුවන උපලේඛණය
## ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ රීති

### නාමය

1. සංගමය ''ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය'' යනුවෙන් හැඳින්විය යුතුය.

### පරමාර්ථ

2. සංගමයේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ :-

(අ) 1914 - 1918 හා 1939 - 1945 යුධ සමයන්හි හෝ ඒ අතර කාලපරිච්ඡේදය තුළ, ලංකාරක්‍ෂක හමුදාවේ හෝ ලංකා රාජකීය කාලතුවක්කු හමුදාවේ හෝ ලංකාවේ නාවික ස්වෙච්ඡා හමුදාවේ හෝ ඉක්බිතිව ලංකා නාවික ස්වෙච්චා උපසේවා හමුදාවේ යම් ඒකකයක සේවය කළ හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් ඒකකයක හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය හමුදා ඒකකයක සේවය කළ සියළුම තරාතිරමේ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන් අතර සහෝදරත්වය හා ලැදියාව වර්ධනය කිරීම :-

### සාමාජිකත්වය

3. 1914 - 18 හා 1939 - 45 යුද්ධ සමයේ යම් කාලපරිච්ඡේදයක් තුළ හෝ ඒ අතරතුර කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවේ පොදු රාජ්‍ය මණ්ඩලීය යම් හමුද ඒකකයක සේවය කළ සියළු ම ශ්‍රී ලංකාවේ පුරවැසියන්, ලංකා රක්ෂක හමුදාවෙහි හෝ ලංකා රාජකීය කාලතුවක්කු හමුදාවෙහි හෝ ලංකා නාවික ස්වෙච්චා හමුදාවෙහි හෝ ඉක්බිතිව ලංකා නාවික ස්වෙච්ඡා උපසේවා හමුදාවෙහි යම් ඒකකයක සේවය කළ සියළුම ශ්‍රී ලංකා පුරවැසියන් හා දැනට ශ්‍රී ලංකාවේ යුධ හමුදාව යනුවෙන් හැඳින්වෙන ලංකා යුද්ධ හමුදාවේ, දැනට ශ්‍රී ලංකා නාවික හමුදාව යනුවෙන් හැඳින්වෙන රාජකීය ලංකා හමුදාවේ හෝ දැනට ශ්‍රී ලංකා ගුවන් හමුදාව යනුවෙන් හැඳින්වෙන රාජකිය ලංකා ගුවන් හමුදාවේ යම් ඒකකයක සේවය කළ සියළුම ශ්‍රී ලංකාවේ පුරවැසියන් සාමාජිකත්වය සඳහා සුදුසු විය යුතුය.

එසේ වූවද 67.12.31 වන දින සංගමයේ සාමාජිකයන්ව සිටි සියළුම ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන අයද සාමාජිකයන් වශයෙන් අඛණ්ඩව සිටිය යුතු අතර, ඔවුන් විසින් සාමාජිකත්වයට අයත් සියළුම වරප්‍රසාද හා ප්‍රයෝජන ඉදිරියටත් භුක්ති විඳිය යුතුය.

විධායක කමිටුව විසින්, එහි අභිමතය පරිදි, 3 වන රීතියේ නියමයට යටතේ සාමාජිකත්වය සඳහා අන්‍යාකාරයෙන් සුදුසු යම් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන සාමාජිකයෙකු ගරු සාමාජිකත්වය සඳහා ඇතුලත් කර ගත හැකිය.

4. (අ) 3 වන රීතිය යටතේ සුදුසුකම් ඇති සේවා මුක්ත භටයෙකු විසින්, අනුබද්ධ සංගමයක සාමාජිකත්වය නිසා හෝ එක වල්ලේම ඉල්ලුම් කිරීමෙන් හෝ සාමාජිකත්වය ලබාගත හැකිය.

(ආ) අනුබද්ධ සංගමයක සාමාජිකයන්, ඒ වෙනුවෙන් ඉල්ලුම් කිරීමෙන් පසු, මේ වගන්තියේ (ඇ) යන්න ඡේදයෙහි අඩංගු විධිවිධානවලට යටත්ව, සංගමයේ සාමාජිකත්වයට ඇතුලත් කර ගනු ලැබිය යුතුය.

(ඇ) අනුබද්ධ සංගමයක සාමාජිකයන් නොවන සේවාමුක්ත භටයන්ගෙන් සාමාජිකත්වය සඳහා වූ ඉල්ලීම් විධායක කමිටුව විසින් සලකා බලනු ලැබිය යුතු අතර, යාවජීව දායක මුදල ගෙවීමෙන් පසු ඒ සේවාමුක්ත භටයන් විධායක කමිටුව විසින් සාමාජිකත්වයට ඇතුලත් කර ගත හැකිය.

(ඈ) විධායක කමිටුව විසින් එහි අභිමතය පරිදි ඕනෑම ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකිය. එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් ඉල්ලුම් කරුවෙකු විසින් නැවත සලකා බැලීම සඳහා මහා මණ්ඩලය වෙත ඉල්ලුම් කල හැකිය.

(ආ) එකී සේවාමුක්ත භටයන්ගේ සුභසිද්ධිය වැඩිදියුණු කිරීම :-

(ඇ) සේවා මුක්ත භටයන් නැවත පදිංචි කරවීම සම්බන්ධයෙන් අවශ්‍ය නියෝජන රජය හා අන් සේවා යෝජකයන් වෙත ඉදිරිපත් කිරීම හා එක් එක් සේවාමුක්ත භටයන් රැකියාවල යෙදවීමෙහි ලා සහය වීම :-

(ඈ) විධායක කමිටුවේ මතය අනුව, මුදල් ආධාර අවශ්‍ය සේවා මුක්ත භටයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට මුදල් ආධාර දීම :-
(සටහන: එවැනි අවස්තාවලදී විධායක කමිටුවේ තීරණය අවසානාත්මක වන අතර, එම තීරණයට විරුද්ධව අභියාචනයක් නොතිබිය යුතුය)

(ඉ) ශ්‍රී ලංකා යුධ හමුදාවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇති තැනැත්තන් විසින් සංගමය හා ඒකාබද්ධ වීම සඳහා බලකායිය හා රෙජිමේන්තුමය සංගම් පිහිටුවා ගැනීම, පිහිටාධාර වීම හා දිරිගැන්වීම ; හා

(ඊ) ඒ කාර්යය සඳහා සාදනු ලබන නියෝගවලට අනුකූලව යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල නඩත්තු කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය.

## අනුබද්ධ සංගම්

5. පහත සඳහන් සංගම් මේ සංගමයට අනුබද්ධ කරනු ලැබේ :-
ලංකා කාලතුවක්කු හමුදා සංගමය,
ලංකා ඉංජිනේරු හමුදා සංගමය,
ලංකා සිග්නල් හමුදා සංගමය,
ලංකා පාබල හමුදා සංගමය,
ලංකා යුධ හමුදා සේවා බලකා සංගමය,
ලංකා යුධ හමුදා වෛද්‍ය බලකා සංගමය,
ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උපසේවා සංගමය,
ඌව සේවා මුක්ත භටයන්ගේ සංගමය,
හා අනුබද්ධ වීම සඳහා කලින් කල ඉල්ලුම් කරන අන්කිසි සේවා හෝ රෙජිමේන්තු සංගමයක්, ඒ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ බලය විධායක කමිටුවට තිබිය යුතුය. එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් සේවා හෝ රෙජිමේන්තු සංගමයක් නැවත සලකා බැලීම සඳහා මහා මණ්ඩලය වෙත ඉල්ලුම් කළ හැකිය.

## සාමාජික මුදල්

6. (අ) අනුබද්ධ සංගම් විසින්, සංගමයේ සාමාජිකත්වය සඳහා ඇතුලත් කර ගනු ලැබූ එක් තැනැත්තෙකුට රුපියල් 1 බැගින් ගණන් බලනු ලබන අනුබද්ධ වීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.

(ආ) 4 (ඇ) වන රීතිය යටතේ ඇතුල්ත කරගනු ලැබූ තැනැත්තන් විසින්, ඉල්ලුම් පත්‍රයක් සමඟ රුපියල් 5 ක යාවජීව සාමාජික මුදලක් ගෙවිය යුතුය. එකී ඉල්ලුම් පත්‍රය විධායක කමිටුව විසින් නියම කරනු ලබන ආකෘතියක විය යුතුය.

## අනුශාසකත්වය

7. මහා මණ්ඩලය විසින් එහි වාර්ෂික රැස්වීමේදී එක් අනුශාසකයෙකු හා තිදෙනෙකුට නොවැඩි උප අනුශාසකයන් ගණනක් පත් කළ හැකිය. ඒ අනුශාසක හා උප අනුශාසකයන් එක් අවුරුද්දකට දූරය දැරිය යුතු නමුදු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

## කළමනාකරණය

8. (අ) සංගමයේ කටයුතු -
- (i) සභාපතිවරයෙකු,
- (ii) උප සභාපතිවරුන් තිදෙනෙකු,
- (iii) ගරු ලේකම්,
- (iv) ගරු උපලේකම්
- (v) ගරු භාණ්ඩාගාරික, හා
- (vi) ගරු උප භාණ්ඩාගාරික

යන මොවුන් විසින් කළමනාකරණය කරනු ලැබිය යුතු අතර ඔවුන් සියලු දෙනාම සංගමයේ නිලධරයන් වශයෙන් හඳුන්වනු ලැබේ:-

එසේ වුවද අනුබද්ධ සංගමයක් විසින් මහා මණ්ඩලයට නියෝජිතයකු වශයෙන් පත්කරනු නොලැබූ කිසිම තැනැත්තෙක් නිළධරයෙකු වශයෙන් තෝරාපත් කරගනු ලැබීම සඳහා ඉදිරිපත් වීමට නුසුදුස්සෙකු නොවන්නේය.

(ආ) පහත සඳහන් බලතල මහා මණ්ඩලයට තිබිය යුතු අතර, ඒවා සම්බන්ධයෙන් මහා මණ්ඩලය වගකිව යුතුය :-
- (i) ගරු උපලේඛම් හා ගරු උපභාණ්ඩාගාරික හැර සංගමයේ නිලධරයන් තෝරා පත් කිරීම ,
- (ii) 10 (අ) (iii) වන රීතියෙහි සඳහන් තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා විධායක කමිටුවට තෝරා පත් කිරීම :

6. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 08 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනත
- (iii) විධායක කමිටුව විසින් ගත් යම් තීරණයක් පුනරීක්ෂණය කිරීම හා එය අවශ්‍ය වුවහොත් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, හා
- (iv) සංගමයේ පොදු ප්‍රතිපත්තිය සකස් කිරීම,

(ඇ) මහාමණ්ඩලය විසින් නියම කරනු ලබන පොදු ප්‍රතිපත්තියට අනුකූලව විධායක කමිටුව විසින් සංගමයේ විධායක පාලනය සම්බන්ධයෙන් වගකිව යුතුය.

9. මහාමණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) සංගමයේ නිලධරයන්ගෙන් ,

(ආ) අනුබද්ධ සංගම් විසින් පහත සඳහන් පරිදි නම් කරනු ලබන නියෝජිතයන්ගෙන්, එනම් :-
සාමාජිකත්වය 100 හා එයට අඩු සංගම්වලින් නියෝජතයන් 5 ,
සාමාජිකත්වය 101 සිට 250 දක්වා ඇති සංගම් වලින් නියෝජතයින් 10,
සාමාජිකත්වය 251 සිට 1000 දක්වා ඇති සංගම් වලින් නියෝජතයින් 15,
සාමාජිකත්වය 1001 සිට 2000 දක්වා ඇති සංගම් වලින් නියෝජිතයින් 20.
හා
සාමාජිකත්වය 2000 වැඩි සංගම් වලින් නියෝජිතයින් 25 බැගින් වූ නියෝජිතයන්ගෙන්, හා

(ඇ) 4 (ඇ) වන රීති යටතේ ඇතුලත් කරනු ලැබූ සාමාජිකයන් නියෝජනය කිරීම පිණිස විධායක කමිටුව විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් (විධායක කමිටුව පටහැනිව ක්‍රියා කිරීමේ සෑහෙන හේතුවක් නැතිනම්, නම් කිරීම් එකී රීති යටතේ ඇතුලත් කරනු ලැබූ සාමාජිකතයන් අතුරෙන් විය යුතුය)

10. (අ) විධායක කමිටුව පහත සඳහන් තැනැත්තාගෙන් සමන්විත විය යුතුය :-

(i) සංගමයේ නිලධරයන්ගෙන් ,

(ii) 9 (ආ) වන රීතිය යටතේ මහාමණ්ඩලයට නම් කරනු ලැබූ තැනැත්තන් අතුරෙන් කරන ලද නම් කිරීම් වල අනුබද්ධ සංගම් විසින් වාර්ෂික නම් කරනු ලැබූ නියෝජතයන්ගෙන්,
(මේ නියෝජිතයන් ''නම් කරනු ලැබූ සාමාජිකයන්''යනුවෙන් නමෝ දිෂ්ඨ වන්නේය.) හා

(iii) 4 (ඇ) වන රීතිය යටතේ ඇතුලත් කරනු ලැබූ සාමාජිකයන් නියෝජනය කිරීම පිණිස තෝරාපත් කරගත් එක් සාමාජිකයෙකුගෙන්

තෝරා පත්කරගත නොහැකි යයි මහාමණ්ඩලයට පෙනී යන්නේ නම් මිස, මේ සාමාජිකයා ඉහත කී රීතිය යටතේ ඇතුළත් කරගනු ලැබූ සාමාජිකයන් අතුරින් තෝරා පත් කරගනු ලැබිය යුතුය.
මේ සාමාජිකයා ''තෝරාපත් කරගත් සාමාජිකයා'' යනුවෙන් නමෝ දිෂ්ඨ වන්නේය.

(අ) අනුබද්ධ සංගම්වලට පහත සඳහන් පරිදි සමාජිකයන් නම් කිරීමට හිමිකම් තිබිය යුතුය.,
සාමාජිකත්වය 250 ට හෝ ඊට අඩු සංගම්වලින් සාමාජිකයන් 1,
සාමාජිකත්වය 251 සිට 1500 දක්වා ඇති සංගම්වලින් සාමාජිකයන් 2,
සාමාජිකත්වය 1, 500 ට වැඩි සංගම්වලින් සාමාජිකයන් 03

(ඇ) සංගමයේ නිලධරයන්, ඔවුන් තෝරා පත්කරගනු ලැබූ දින සිට ඊළඟ වාර්ෂික රැස්වීම තෙක් ධූර දැරිය යුතුය.

(ඈ) සියළුම නම් කරනු ලැබූ සාමාජිකයන් හා තෝරාපත් කළ සාමාජිකයා, ඔවුන් නම් කරනු ලැබීමෙන් පසුව එළඹෙන මහාමණ්ඩලයේ වාර්ෂික රැස්වීමට පසු දින සිට ඊළඟට එළඹෙන වාර්ෂික රැස්වීම තෙක් ධූර දැරිය යුතුය.

11. මහාමණ්ඩලයේ හා විධායක කමිටුවේ පුරප්පාඩු මහාමණ්ඩලයේ ඊළඟ වාර්ෂික රැස්වීම තෙක් පහත සඳහන් පරිදි පුරවනු ලැබේ :-

(අ) නම් කරනු ලැබූ සාමාජිකයින් සම්බන්ධයෙන් වූ විට අදාළ අනුබද්ධ සංගම් විසින් හා
(ආ) සෙසු පුරප්පාඩු සම්බන්ධයෙන් වූ විට විධායක කමිටුව විසින් තෝරා පත් කිරීමෙන්

12. කලින් කල අවශ්‍ය විය හැකි යම් අනුකමිටු පත් කිරීමේ බලය විධායක කමිටුවට තිබිය යුතුය. සුදුසුයැයි අනු කමිටු සලකන යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් මීට අමතරව තෝරා පත් කර ගැනීමේ බලය ඒ අනු කමිටු වල තිබිය යුතුය.

## රැස්වීම

13. මහා මණ්ඩලය වර්ෂයකට වරක් රැස්විය යුතුය. ඒ වාර්ෂික රැස්වීම එක් එක් වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වන දිනට පසු හැකි ඉක්මනින් එහෙත් කිසිම අවස්ථාවක 31 වන දින ඉකුත් වීමට පෙර පැවැත්විය යුතුය.

14. එය වාර්ෂික රැස්වීම් පිළිබඳ දැන්වීම යටත් පිරිසෙයින් දින විසි අටකට වත් කලින් අනුබද්ධ සංගම් වෙත ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් කළ යුතුය.

15. (අ) විධායක කමිටුවේ වාර්තාව හා පූර්ව මුදල් වර්ෂයේ විගණනය කරනු ලැබූ ගණන් මහා මණ්ඩලයේ එකී වර්ෂික රැස්වීමේ දී පිළිගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) සංගමයේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ඔක්තෝම්බර් මස 01 වන දින ආරම්භ වී ඊළඟ වර්ෂය සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් විය යුතුය.

16. සංගමයේ නිලධරයන් (විධායක කමිටු විසින්) පත් කළ යුතු ගරු උපලේඛම් හා ගරු උප භාණ්ඩාගාරික හැර) මහා මණ්ඩලයේ වාර්ෂික රැස්වීමේදී තෝරා පත් කරනු ලැබිය යුතුය.

17. (අ) සංගමයේ යම් සාමාජිකයෙකු විසින් මහා මණ්ඩලයේ වාර්ෂික රැස්වීමේදී යෝජනා කිරීමට නියමිත යම් යෝජනාවක් පිළිබඳව යටත් පිරිසෙයින් මාස හතරකටවත් කලින් වූ ලිඛිත දැන්වීමක් ගරු ලේකම් වෙත කළ යුතුය.

(ආ) ඉහතින් වූ (අ) ඡේදයෙහි සඳහන් යෝජනාවක් පිළිබඳ කැඳවීමක් කරන මහා මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන යම් සාමාජිකයෙකුට වාර්ෂික රැස්වීමට පැමිණ ඒ යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු නමුදු ඒ යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය දීමට ඔහුට අවසර නොදිය යුතුය.

(ඇ) මහාමණ්ඩලයේ වාර්ෂික රැස්වීමේ න්‍යාය පත්‍රය ඒ රැස්වීමට පෙර යටත් පිරිසයින් දින හතකටවත් පෙර මහා මණ්ඩලයේ සියලු සාමාජිකයන් වෙත ලියවිල්ලකින් නිවේදනය කළ යුතුය. ඒ නිවේදනයේ සාමාජිකයින් වෙත, ඔවුන් සාමාජිකයන්ව සිටින අනුබද්ධ සංගම් මඟින් නිකුත් කරනු ලැබිය යුතුය.

18. මහා මණ්ඩලයේ වාර්ෂික රැස්වීමේ ඝණපූරණය 40 ක් විය යුතුය.

19. (අ) විධායක කමිටුව විසින්, හදිසි කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ඕනෑම අවස්ථාවක මහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය හැකිය.

(ආ) අනුබද්ධ සංගම් තුනකින් හෝ මහා මණ්ඩලයේ සාමාජිකයින් තිස්පස් දෙනෙකුගෙන් මහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ඉල්ලීමක් ලැබී දින විසි අටක් ඇතුළත ඒ විශේෂ රැස්වීම කැඳවීමට ගරු ලේකම් බැඳී සිටින්නේ ය. ඒ ඉල්ලීම් ලියවිල්ලකින් විය යුතු අතර, ඒ විශේෂ රැස්වීමේදී සාකච්ඡා කරනු ලබන කරුණු එනමින් නිශ්චිතව දැක්විය යුතුය.

(ඇ) මහා මණ්ඩලයේ එවැනි විශේෂ රැස්වීමක න්‍යාය පත්‍රය මහා මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත ඒ රැස්වීමට යටත් පිරිසයින් දින හතකටවත් පෙර ලියවිල්ලකින් නිවේදනය කළ යුතුය. ඒ නිවේදනය සාමාජිකයින් වෙත, ඔවුන් සාමාජිකයන්ව සිටින අනුබද්ධ සංගම් මඟින් නිකුත් කරනු ලැබිය යුතුය.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනත

අංක 20 මහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවන දැන්වීමෙහි නිශ්චිතව සඳහන් නොවන කිසිම කටයුත්තක් ඒ රැස්වීමේදී සාකච්ඡාවට භාජනය නොකළ යුතුය.

21. මහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක් පිළිබඳව යටත් පිරිසෙයින් දින දහහතරකටවත් පෙර දැන්වීමක් අනුබද්ධ සංගම් වෙත හා ප්‍රවෘත්ති පත්‍ර මඟින් කළ යුතුය.

22. මහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක ගණපූරණය හතලිහක් විය යුතුය.

23. විධායක කමිටුව සෑම මාස දෙකකට වරක් වත් රැස්විය යුතුය.

24. විධායක කමිටු රැස්වීමක ඝණපූර්ණය 8 ක් විය යුතුය.

## මුදල්

25. (අ) යුද්ධදයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුල නමින් වූ බැංකු ගිණුමකට බැර කළ යුතු එම අරමුදලට අයත් මුදල් හැර සංගමයේ සියලුම මුදල් සංගමයේ නමින් වූ බැංකු ගිණුමකට බැර කරනු ලැබිය යුතුය.

(ආ) සියලුම ගෙවීම් විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබිය යුතු අතර සියළුම චෙක්පත් ගරු භාණ්ඩාගාරික විසින් හා පහත සඳහන් නිලධරයන්ගෙන් එක් කෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය. :-

(i) සභාපති,

(ii) එක් උප සභාපතිවරයෙක්.

(iii) ගරු ලේකම්

26. සංගමයේ ගිණුම මහාමණ්ඩලයේ වාර්ෂික රැස්වීමට ඉදිරිපත් කිරීමට පෙර මහා මණ්ඩලයේ ඉකුත් වාර්ෂික රැස්වීමේදී පත් කරනු ලැබූ විගණකයන් විසින් විගණනය කළ යුතුය.

## සාමාන්‍ය විධිවිධාන

27. රීති පිළිබඳ කිසිඳු වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් මහා මණ්ඩලයේ වාර්ෂික හෝ විශේෂ රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසයින් තුනෙන් දෙකකවත් වැඩි ඡන්දයෙන් අනුමත කරනු ලැබුවේ නම් මිස, එය වෙනස් කිරීම හෝ සංශෝධනය වලංගු නොවිය යුතුය.

28. (අ) රීති වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා වූ යම් යෝජනාවක් පිළිබඳ දැන්වීම, මහා මණ්ඩලයේ වාර්ෂික හෝ විශේෂ රැස්වීමට යටත් පිරිසෙයින් දින දහහතරකටවත් කලින් ගරු ලේකම් වෙත සංගමයේ ඕනෑම සාමාජිකයෙකු විසින් ලියවිල්ලකින් කරනු ලැබිය යුතුය. ගරු ලේකම් විසින් ඒ යෝජනාව පිළිබඳ දැන්වීම රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් කළ යුතුය.

(ආ) ඉහතින් දැක්වුණු (අ) ඡේදයෙහි සඳහන් යෝජනාවක් පිළිබඳ දැන්වීම කරන මහා මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන යම් සාමාජිකයෙකු වාර්ෂික රැස්වීමට පැමිණ ඒ යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු නමුදු ඡන්දය දීමේ බලය ඔහුට නොතිබිය යුතුය.

29. ඉහතින් දැක්වුණු රීතිවලින් විධිවිධාන සලස්වනු නොලැබූ යම් විෂයක් සම්බන්ධයෙන් විධායක කමිටුව විසින් ක්‍රියා කරනු ලබන්නේය. එවැනි සියළු කරුණු සම්බන්ධයෙන් විධායක කමිටුවේ තීරණය අවසානාත්මක විය යුතුය :- එසේ වුවද මහා මණ්ඩලය සුදුසු යැයි සලකන්නේ නම් මහා මණ්ඩලය විසින් එවැනි යම් තීරණයක් පුනරීක්ෂණය කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකිය

30. මේ ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ද සංගමයේ ක්‍රියාකාරීත්වය හා කළමනාකරණය සඳහා ද විධායක කමිටුව විසින් කලින් කළ නියෝග කෙටුම්පත් කළ හැකි අතර, ඒවා අනුමැතිය සඳහා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

31. සංගමයට, විධායක කමිටුවේ අභිමතය පරිදි, සමාන අරමුණු හා පරමාර්ථ ඇති විදේශීය සංවිධාන (එනම්, ජගත් යුද්ධ ශූරින්ගේ ඒකාබද්ධ සංගමය, බ්‍රිතාන්‍යයයීය පොදු රාජ්‍ය මණ්ඩලීය යුද්ධ භටයන්ගේ සංගමය) සමග අනුබද්ධ විය හැකිය.

32. නම් කරනු ලැබූ එක් සාමාජිකයෙකු සංගම් වෙනුවෙන් විධායක කමිටුවෙහි පෙනී සිටින අවස්ථාවක විධායක කමිටු රැස්වීමකට සහභාගී වීමට එකී නම් කරනු ලැබූ සාමාජිකයාට නොහැකි වුවහොත් එකී සංගමයේ සභාපති විසින් යථාපරිදි බලය පවරන ලද

ආදේශකයෙකුට එකී නම් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට ඒ විධායක කමිටු රැස්වීමෙහි පෙනී සිටීමට අවසර දෙනු ලබන අතර, විධායක කමිටුවේ නම් කරනු ලැබූ සාමාජිකයා විසින් කරන ලද සියළු බලතල ඒ ආදේශකයාට තිබිය යුතුය.

33. මේ රීතිවල කාර්යයන් සඳහා සහ ඒ වැකියෙහි -

(අ) ''සේවාමුක්ත භටයන්'' යන්නෙන් 3 වන රීතියෙහි අඩංගු විස්තරය අදාළ තැනැත්තන් අදහස් වේ :-

(ආ) ''සංගමය'' යන්නෙන් ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය අදහස් වේ.

## දෙවන උපලේඛණය
## යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා අරමුදල)
## නියෝග

01. පොපි මල් දිනයෙහි එකතුවන මුදල් හා පරිත්‍යාග හෝ දායක මුදල් වශයෙන් අරමුදලට ලැබෙන සියළුම මුදල් භාරව සිටීම එකතු කිරීම හා වියදම් කිරීම සම්බන්ධයෙන් යුද්ධ දයානුග්‍රහ ශ්‍රී ලංකා) අරමුදල වගකිව යුතුය.

02. පොපි මල් දිනය හා යුද්ධයෙහි මියගියවුන් සිහිකිරීමේ දිනය සම්බන්දයෙන් සියලු කටයුතු පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු හා අවශ්‍ය බලය ඇති ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය විසින් යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල දැරිය යුතු මෙන්ම එය පරිපාලනය ද කළ යුතුය.

03. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදලෙන් කරනු ලබන සියළු වියදම් ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් සහතික කරනු ලැබිය යුතුය.

04. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදලට අයත් සියළුම මුදල් කොළඹ චාටඩ් බැංකුවේ පවත්නා අරමුදලෙහි ගිණුමෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

05. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංකා) අරමුදල වෙනුවෙන් ලියනු ලබන චෙක්පත් අත්සන් කිරීමට සභාපතිවරයාට, උප සභාපතිවරුන්ට, ගරු ලේකම් වරයාට හා ගරු භාණ්ඩාගාරිකට බලය පවරනු ලබන අතර, ගරු භාණ්ඩාගාරිකගේ හා ඉහත සඳහන් නිලධාරීන්ගෙන් එක් කෙනෙකුගේ අත්සන් ප්‍රමාණවත් වේ.

06. යුද්ධ දයානුග්‍රහ (ශ්‍රී ලංතා) අරමුදලේ සාමාන්‍ය පරමාර්ථ දුගී, වයස්ගත, බෙලහීන, අසාද්‍ය හා අනාථ සේවාමුක්ත භටයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට මුදලින් ආධාර, වෛද්‍යාධාර හා පෝෂ්‍ය ආහාර සැපයීමත් සාමාන්‍යයෙන් ඔවුන්ගේ සුභසිද්ධිය තහවුරු කිරීමත් විය යුතුය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1992 අංක 42 දරන
# ශ්‍රී ලංකා සේවා මුක්ත
# භටයන්ගේ සංගමය
# (සංශෝධන) පනත

**(සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින)**
**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

**1992 අගෝස්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනත**

## 1992 අංක 42 දරණ ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත

(පනත සහතිකය සටහන් කලේ 1992 අගෝස්තු මස 17 වන දින) එල්.ඩී. - ඕ. 72/90

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

1. මේ පනත 1992 අංක 42 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

2. මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරණ ශ්‍රී ලංකා සේවාමුක්ත භටයන්ගේ සංගමයේ පනතේ 3 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ ''දිරිගැන්වීම. ; හා'' යන වචන වෙනුවට ''දිරිගැන්වීම'', යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ ''පවත්වාගෙන යෑම හා කළමනාකරණය'' යන වචන වෙනුවට, පවත්වාගෙන යාම හා කළමනාකරණය; සහ''යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :-
''(උ) ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම උදෙසා දිවි පුදන ලද හමුදා භටයන් සදානුස්මරණ කිරීම.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :-

''(1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, නිලධරයන්, මහා සභාවේ සහ විධායක කොමිටියේ සාමාජිකයන්ගේ කාර්යය ඉටු කිරීම සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේදී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය සඳහා සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා, සංස්ථාව විසින් මහා සභාවේ වාර්ෂික මහාසභා රැස්වීමකට හෝ විශේෂ මහාසභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක සංවිධානවලට අනුකූල නොවන රීති සාදනු ලැබිය හැකිය.'' සහ

(ආ) ඒ වගන්තියේ (2) උප වගන්තියේ ''සංස්ථාවේ මහා සභා රැස්වීමක දී'' යන වචන වෙනුවට ''මහා සභාවේ වාර්ෂික මහා රැස්වීමක දී හෝ විශේෂ රැස්වීමක දී'' යන වචන ආදේශ කිරීමෙන්

| | | |
|---|---|---|
| ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන ලේඛනය සංශෝධනය කිරීම. | 4. | ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛණය දැක්වෙන අංක 27 වන රීතිය ඉවත් කිරීමෙන් ඒ උපලේඛණය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව | 5. | මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. |

# සටහන්